# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2417/14 - 2024 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2024.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2024 අංක 1 දරන වෙළඳ නැව් (සම්මුතිය නොවන යාත්‍රා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

***මේ නියෝගවල අදාළත්වය***

2. (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන අනුනියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති සම්මුතිය නොවන යාත්‍රාවලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන සම්මුතිය නොවන විදේශීය යාත්‍රාවලට අදාළ විය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මේ නියෝග-

(අ) යුධ නෞකා සහ සෙබළ නෞකා සඳහා; සහ

(ආ) ධීවර යාත්‍රාවලට,

අදාළ නොවිය යුතු ය.

(3) මේ නියෝගවල II වන, IV වන, V වන සහ VII වන කොටස් 2024 දෙසැම්බර් මස 31 වන දිනැති අංක 2417/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2024 අංක 3 දරන වෙළඳ නැව් (යාත්‍රා වර්ගීකරණය කිරීමේ සහ සහතික කිරීමේ) නියෝගවල සඳහන් 4 වන කාණ්ඩයෙහි (ක්‍රීඩා හෝ විනෝදය සඳහා පෞද්ගලිකව භාවිත කරන යාත්‍රා (කුළියට ගැනීම සඳහා නොවන යාත්‍රා) වර්ගීකරණය කර ඇති යාත්‍රා සඳහා අදාළ නොවිය යුතු ය.

(4) මේ නියෝග බලාත්මක වන දිනයෙන් පසුව ශ්‍රී ලංකාව තුළ භාවිතය සඳහා ආනයනය කරනු ලබන හෝ ඉදිකරනු ලබන (3) වන අනුනියෝගයේ සඳහන් 4 වන කාණ්ඩයේ යාත්‍රා මේ නියෝගවල III වන කොටස් දැක්වෙන තාක්ෂණික සංග්‍රහයන්ට අනුකූල විය යුතු ය.

3. (මේ නියෝගවල "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ නියෝග පරිපාලනය සඳහා වගකිව යුතු ය.

## II වන කොටස

## ලියාපදිංචි කිරීම

4. (1) මේ නියෝග අදාළ වන සෑම යාත්‍රාවක් ම පහත දැක්වෙන වලංගු සහතික නෞකාස්ථව නොමැතිව මෙහෙයවනු නොලැබිය යුතු යː-

(අ) ලියාපදිංචි කිරීමේ සහතිකය;

(ආ) 2024 දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 2417/16 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2024 අංක 3 දරන වෙළඳ නැව් (යාත්‍රා වර්ගීකරණය කිරීමේ සහ සහතික කිරීමේ) නියෝග මගින් නියම කර ඇති සහතික;

(ඇ) P & I රක්ෂණ සහතිකය; සහ

(ඈ) නාවික පිරිසේ බලපත්‍ර සහ පුහුණු සහතික.

(2) (1) වන අනුනියෝගය උල්ලංඝණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

5. (1) සම්මුතිය නොවන යාත්‍රාවන් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන පරිදි, මේ නියෝගවල III වන උපලේඛනයේ සඳහන් අදාළ ගාස්තුව ද සමඟ නෞකා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය මේ නියෝගවල I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ලේඛන සමඟ තහවුරු කරනු ලැබිය යුතු යː-

(අ) අනුමත පිළිගත් සංවිධානයක් හෝ සහතික කරන ආයතනයක් විසින් නිකුත් කරනු ලබන, අදාළ තාක්ෂණික සංග්‍රහය සමඟ සැසඳෙන අනුකූලතා වාර්තාවක්, තාක්ෂණික සංග්‍රහයන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි සම්මත ප්‍රමිතිකරණ සංගමයේ රීතිවලට සමාන රීතිවලට අනුකූලව ඉදිකරන ලද යාත්‍රා, තාක්ෂණික සංග්‍රහයන්හි අනෙකුත් සියලු ම නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට යටත්ව, මේ නියෝග යටතේ පිළිගනු ලැබිය යුතු ය;

(ආ) සමීක්ෂණ සහ ටොන් බර පිළිබඳ මිනුම් සහතිකය;

(ඇ) යාත්‍රාව මීටර් 24 ට වැඩි නම්, ටොන් බර පිළිබඳ සහතික;

(ඈ) හිමිකම් ලේඛන (විකුණුම් පත්‍රය)

(ඉ) ලියාපදිංචි කිරීම සමාගමක් වෙනුවෙන් සිදු කරනු ලබන්නේ නම්, සමාගමේ සංස්ථාගත කිරීමේ සහතිකය;

(ඊ) මින් පෙර වෙනත් රෙජිස්ටරයක ලියාපදිංචි කර ඇත්නම්, ඉවත් කිරීමේ සහතිකය;

(උ) (අදාළ වන පරිදි) ගුවන් විදුලි ඇමතුම් සංඥා පිළිබඳ තහවුරු කිරීම; සහ

(ඌ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පිළිගත් රක්ෂණ සමාගමකින් ලබාගෙන ඇත්තා වූ ද, යාත්‍රාවේ සාමාජිකයන්, මගීන් සහ භාණ්ඩ ආවරණය වන්නා වූ ද, යාත්‍රාව සඳහා වන වලංගු සහ සවිස්තරාත්මක P & I රක්ෂණාවරණයක්.

(4) ඉල්ලුම් පත්‍රයක් සහ තහවුරු කිරීමේ ලේඛන නෞකා රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අනුකූල බවට තීරණය කරනු ලැබුවහොත්, සමීක්ෂණය අවසන් වන තෙක් මාස හයක කාලසීමාවක් සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුකූලතා වාර්තාව පරීක්ෂා කිරීම අවසන් කොට අදාළ තාක්ෂණික සංග්‍රහ සහතිකය නිකුත් කිරීමෙන් පසුව, මේ නියෝගවල II වන උපලේඛනයේ සඳහන් පූර්ණ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) ලියාපදිංචි කිරීමේ සහතිකය යාත්‍රාවේ ජීවිත කාලය පුරාවට ම වලංගු විය යුතු අතර, යාත්‍රාවේ හිමිකාරිත්වයේ වෙනසක් වූ විට හෝ යාත්‍රාවට සැලකිය යුතු වෙනස් කිරීම් සිදු කළ විට පමණක් එකී ලියාපදිංචි කිරීමේ සහතිකය නැවත නිකුත් කරනු ලැබිය යුතු ය.

6. (1) මේ නියෝග අදාළ වන සෑම යාත්‍රාවක ම, එකී යාත්‍රාව ක්‍රියාත්මක වන කාලය තුළ දී, යාත්‍රා සහතිකයේ සඳහන් පරිදි උපරිම වශයෙන් නෞකාස්ථව රැගෙන යාමට අවසර දෙන ලද තැනැත්තන් සංඛ්‍යාව නොඉක්මවනු ලැබිය යුතු ය. මගී යාත්‍රා නොවන යාත්‍රා සම්බන්ධයෙන් වන විට, එවැනි යාත්‍රාවක් විසින් උපරිම වශයෙන් රැගෙන යාමට අවසර දෙන ලද තැනැත්තන් සංඛ්‍යාව දක්වා වූ නාවික පිරිසක් සහ විශේෂ පිරිසක් හෝ මගීන්, නාවික පිරිස සහ විශේෂ සේවක පිරිසකගේ එකතුවෙන් සැදුම්ලත් කණ්ඩායමක් රැගෙන යනු ලැබිය හැකි ය;

එසේ වුව ද, මේ අනුනියෝගයේ විධිවිධාන, උපරිම වශයෙන් මගීන් දොළොස්දෙනෙකුට අඩු සංඛ්‍යාවක් රැගෙන යන යාත්‍රාවක් සඳහා අදාළ නොවිය යුතු ය.

(2) (1) වන අනුනියෝගය උල්ලංඝණය කරන යම් තැනැත්තකු විසින්, මේ නියෝග යටතේ වරදක් සිදුකරනු ලබන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

7. (1) තරඟ සඳහා හෝ රෙගටා සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින යාත්‍රා මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීමෙන් නිදහස් විය යුතු ය.

(2) තරඟ හෝ රෙගටා සඳහා සහභාගී වන බෝට්ටු සඳහා ආධාරක බෝට්ටු වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණ රැඳී සිටින යාත්‍රා, අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් මාස හයක කාලයක් සඳහා වලංගු තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීමක් ලබාගනු ලැබිය යුතු යː-

(අ) ධජය අයත් රාජ්‍යයේ ජාතික අධිකාරිය විසින් නිකුත් කරනු ලබන වලංගු සමීක්ෂණ වාර්තාවක්; සහ

(ආ) යාත්‍රාව සඳහා වන සවිස්තරාත්මක P & I රක්ෂණාවරණයක්.

## III වන කොටස

*තාක්ෂණික සංග්‍රහ සහ තාක්ෂණික විශේෂඥ මණ්ඩලය*

8. (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද සම්මුතිය නොවන සියලු ම යාත්‍රා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පළ කරනු ලැබූ (2) වන අනුනියෝගයේ නියම කර ඇත්තා වූ අදාළ තාක්ෂණික සංග්‍රහයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) එකී තාක්ෂණික සංග්‍රහයන් පහත දැක්වෙන පරිදි වන්නේ ය:-

(අ) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා සංග්‍රහය;

(ආ) කුඩා යාත්‍රා සංග්‍රහය (දිග මීටර් 24 ක් දක්වා වූ);

(ඇ) සම්මුතිය නොවන විශාල යාත්‍රා සංග්‍රහය (දිග මීටර් 24ට වැඩි); සහ

(ඈ) විශාල යොට් යාත්‍රා සංග්‍රහය (දිග මීටර් 24ට වඩා වැඩි)

9. (1) (මේ නියෝගවල "වෙළඳ නැව් පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 12 වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මූලිකත්වයෙන් යුත් තාක්ෂණික විශේෂඥ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය. තව ද, වෙළඳ නැව් පනත යටතේ තාක්ෂණික සංග්‍රහයක් පළ කිරීමේ සහ පවත්වාගෙන යාමේ බලතල එකී තාක්ෂණික විශේෂඥ මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු අතර, එකී තාක්ෂණික විශේෂඥ මණ්ඩලය විසින් එසේ පළ කරනු ලබන එකී අදාළ තාක්ෂණික සංග්‍රහයන් මේ නියෝග යටතේ පළ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) තාක්ෂණික විශේෂඥ මණ්ඩලයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) තාක්ෂණික සංග්‍රහයන් පළමුවන වරට පළ කරනු ලැබූ දින සිට වසරකින් පසු ඒවා සමාලෝචනය කර සංශෝධනය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ආරක්ෂක හේතු මත සංශෝධන සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් හැර, සෑම වසර පහකට වරක් ම තාක්ෂණික සංග්‍රහයන් සමාලෝචනය කර ඊට සංශෝධන සිදු කිරීම; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලබන පරිදි අදාළ සංග්‍රහයන් සම්බන්ධයෙන් අර්ථ නිරූපණ සැපයීම.

(3) (1) වන අනුනියෝගයේ සඳහන් තාක්ෂණික විශේෂඥ මණ්ඩලය, නාවික නිර්මාණ ශිල්පය, සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, නෞකාධිපති සහ බෝට්ටු ඉදි කිරීමේ තාක්ෂණය යන වෘත්තීය විශේෂඥතා ක්ෂේත්‍ර නියෝජනය වන තැනැත්තන් සිව්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(4) එසේ පත් කරනු ලබන තාක්ෂණික විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් වෘත්තීය සුදුසුකම්ලත් සහ පළපුරුද්ද සහිත තැනැත්තන් විය යුතු අතර -

(අ) ශ්‍රී ලංකා නෞකාධිපති සමාගම්;

(ආ) ශ්‍රී ලංකා ප්‍රධාන ඉංජිනේරු සංගමය;

(ඇ) රාජකීය නාවික නිර්මාණ ශිල්පී ආයතනය (එක්සත් රාජධානිය);

(ඈ) නාවික නිර්මාණ ශිල්පී සහ සමුද්‍රීය ඉංජිනේරු සංගමය (ඇමෙරිකා එක්සත් ජනපදය);

(ඉ) නාවික ආයතනය (එක්සත් රාජධානිය);

(ඊ) සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා, විද්‍යා සහ තාක්ෂණ ආයතනය (එක්සත් රාජධානිය) ; සහ

(උ) ලංකා බෝට්ටු ඉදිකිරීමේ තාක්ෂණය වැඩිදියුණු කිරීමේ ආයතනය (BTI)

වැනි උචිත වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (අවම වශයෙන් එහි සාමාජිකයකු ලෙස) දරනු ලැබිය යුතු ය.

(5) තාක්ෂණික විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයකු වසර හතරක කාලසීමාවක් සඳහා සේවය කිරීමට පත් කරනු ලැබිය යුතු අතර, මුදල් අමාත්‍යාංශය විසින් නිශ්චිතව දක්වනු ලබන අනුපාතයට අනුකූලව, ඉටු කරනු ලබන කාර්යය සඳහා වේතනයකට එකී සාමාජිකයා හිමිකම් ලැබිය යුතු ය.

## IV වන කොටස

*සමීක්ෂණය කිරීම සහ සහතික කිරීම*

10. (1) සම්මුතිය නොවන සියලු ම යාත්‍රා අදාළ තාක්ෂණික සංග්‍රහයට අනුකූලව පරීක්ෂා කිරීම, සමීක්ෂණය කිරීම, සහතික කිරීම සහ නඩත්තු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග අදාළ වන්නා වූ, සම්මුතිය නොවන යාත්‍රා පරීක්ෂා කිරීම සහ සමීක්ෂණය කිරීම සහ එකී යාත්‍රා සඳහා අදාළ සහතික නිකුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(3) (3) වන අනුනියෝගයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන අනුනියෝගයේ කාර්යය සඳහා පිළිගත් සංවිධානවලට හෝ සහතික කරන ආයතනවලට බලය දෙනු ලැබිය හැකි ය.

(4) දළ ටොන් 100 ඉක්මවන, සම්මුතිය නොවන යාත්‍රා සමීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ සහතික කිරීම පිළිගත් සංවිධාන විසින් පමණක් සිදු කරනු ලැබිය යුතු ය.

11. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022 ජනවාරි මස 6 වන දින අංක 2262/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගවල විධිවිධානවලට අනුකූලව පිළිගත් සංවිධානවලට බලය දෙනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, විගණනයක් කිරීමෙන් පසු, යම් සංවිධානයක් නියමයන්ට අනුකූල වන්නා වූ සහතික කරන ආයතනයක් ලෙස පිළිගනු ලැබිය යුතු අතර, ඒ සංවිධානය සමඟ ලිඛිත ගිවිසුමක් ඇති කරගනු ලැබිය යුතු ය. එම ගිවිසුමෙන්, අභිනියෝජනයට අදාළ විෂය පථය අර්ථ නිරූපනය කරනු ලැබිය යුතු ය.

(3) සහතික කරන ආයතනයක් -

(අ) සතුව වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු අතර, අභිනියෝජනය කරන ලද සමීක්ෂණයන් සිදු කිරීමට අවශ්‍ය සම්පත් එකී සහතිකකරන ආයතනය තුළ තිබිය යුතු ය;

(ආ) 9 වන නියෝගයේ සඳහන් පරිදි උචිත වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය දරන වෘත්තිකයන්ගෙන් සමන්විත විය යුතු ය;

(ඇ) යාත්‍රා හිමිකරුවන්ගේ සහ මෙහෙයවන්නන්ගේ අවශ්‍යතා කාර්යක්ෂම ලෙස පාලනය කිරීමට අවශ්‍ය වූ ප්‍රමාණවත් ශක්නුතාව සහ හැකියාව තිබිය යුතු ය; සහ

(ඈ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් MSC, 349(92) යෝජනා සම්මතයෙන් පළ කරන ලද, පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8, සහ 4.2 වගන්තිවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය; සහ

(ඉ) සහතිකකරන ආයතනයක් ලෙස කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියක් දරනු ලැබිය යුතු ය.

(4) මේ නියෝගයේ (3) වන අනුනියෝගයේ නියම කර ඇති නියමයන්ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සහතිකකරන ආයතන සම්බන්ධයෙන් කාලානුරූපීව විගණනයන් සිදු කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

*පිරිස් යෙදවීම*

12. වාණිජ මෙහෙයුම්වල යෙදෙන, සම්මුතිය නොවන සියලුම යාත්‍රාවල පිරිස් යෙදවීම මේ කොටසේ නියෝගවලට අනුකූල විය යුතු ය.

13. (1) සම්මුතිය නොවන යාත්‍රාවක නෞකාධිපතිවරයකු සහ නෞකාස්ථ නාවික පිරිසේ අනෙකුත් සාමාජිකයන් විසින් 2024 දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 2417/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2024 වෙළඳ නැව් (දේශීය මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ) නියෝගවලට සහ වෙනත් අදාළ නීතිවලට අනුකූලව යාත්‍රාවට අදාළ වන උචිත බලපත්‍රයක් සහ සහතික දරනු ලැබිය යුතු ය.

(2) විශේෂ මෙහෙයුම්වල යෙදෙන හෝ අභ්‍යන්තර ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වන යාත්‍රාවල නෞකාධිපතිවරයකු හෝ නාවික පිරිස විසින් සුදුසු පිටසන් ද සමග බලපත්‍ර දරනු ලැබිය යුතු ය.

(3) 4, 5, 6, 7, 8 හෝ 9 ට අයත් ප්‍රදේශ කාණ්ඩවල ක්‍රියාත්මක වන යාත්‍රාවල නෞකාධිපතිවරයකු හෝ නාවික පිරිසේ සාමාජිකයන් විසින් මූලික ප්‍රථමාධාර සම්බන්ධයෙන් අනුමත නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය.

(4) නාවික පිරිසේ වෙනත් යම් සාමාජිකයකු විසින්, සමාන හෝ ඉහළ මට්ටමක වූ වෛද්‍ය හෝ හෙද සේවය පිළිබඳ සුදුසුකමක් දරනු ලබන්නේ නම් මිස, 0R, 1, 2 හෝ 3 ට අයත් ප්‍රදේශ කාණ්ඩවල ක්‍රියාත්මක වන යාත්‍රාවල නෞකාධිපතිවරුන් විසින් වෛද්‍ය සත්කාර සම්බන්ධයෙන් නිපුණතා සහතිකයක් දරනු ලැබිය යුතු ය. නෞකාධිපතිවරයා හෝ නම් කරන ලද ප්‍රථමාධාරකරුවකු විසින් යටත් පිරිසෙයින් සෑම වසර පහකට වරක් සංස්කරණ පුහුණුවක් ලැබිය යුතු ය.

(5) 0R, 1, 2 හෝ 3 ට අයත් ප්‍රදේශ කාණ්ඩවල ක්‍රියාත්මක වන යාත්‍රාවල නෞකාධිපතිවරුන් විසින්, මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ (STCW ව්‍යවස්ථා සංග්‍රහය) A-V/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පිරිස් කළමනාකරණය පිළිබඳ පුහුණු සහතිකයක් දරනු ලැබිය යුතු ය.

14. (1) යම් මුහුදු ගමනක් ආරම්භ කිරීමට පෙර, නෞකාධිපතිවරයකු විසින්, නෞකාවේ නෞකාස්ථ සියලු ම තැනැත්තන්ට, අවම වශයෙන් ජීවිතාරක්ෂක ජැකට්ටු, තාප ආරක්ෂණ ආධාරක සහ ජීවිතාරක්ෂක බෝයාවන් වැනි පෞද්ගලික ආරක්ෂක උපකරණ ගබඩා කිරීම සහ භාවිත කිරීම සහ හදිසි අවස්ථාවල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා වගබලා ගනු ලැබිය යුතු ය.

(2) නෞකාවේ නෞකාස්ථව සිදු කරන එක් එක් උපදෙස් දීමක් අවසන් වීමෙන් පසු, නෞකාධිපතිවරයකු විසින්, ඒ සම්බන්ධයෙන් නිල ලොග් පොතේ සටහනක් තබනු ලැබිය යුතු ය.

15. සම්මුතිය නොවන යාත්‍රාවල අයිතිකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින්, මුහුදු ගමනේ ස්වභාවය සහ කාලය සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින්, යාත්‍රාව මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් පුහුණු සේවක පිරිසක් එහි නෞකාස්ථව සිටින බවට වගබලා ගනු ලැබිය යුතු ය.

16. සම්මුතිය නොවන සෑම යාත්‍රාවක ම, යටත් පිරිසෙයින්, නෞකාස්ථ ගුවන් විදුලි උපකරණ සහ අදාළ මෙහෙයුම් ප්‍රදේශය සඳහා ගැලපෙන, උචිත ගුවන් විදුලි ක්‍රියාකරු සහතිකයක් දරන එක් තැනැත්තකුවත් සිටිය යුතු ය.

17. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සම්මුතිය නොවන එක් එක් යාත්‍රාව සඳහා වන අවම පිරිස් යෙදවීමේ මට්ටම් අදාළ තාක්ෂණික සංග්‍රහය යටතේ එම යාත්‍රාව වෙත නිකුත් කරනු ලබන සහතිකයෙහි නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) එකී යාත්‍රාවේ පිරිස් යෙදවීම (1) වන අනුනියෝගයේ සඳහන් සහතිකයේ නියම කර ඇති ආරක්ෂක පිරිස් යෙදවීමේ මට්ටමට අනුකූලව නම් මිස, මේ සම්මුතිය නොවන යම් යාත්‍රාවක් විසින්, මුහුදු ගමනක් හෝ චාරිකාවක් ආරම්භ කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන අනුනියෝගය උල්ලංඝණය කරන යම් තැනැත්තකු විසින්, මේ නියෝග යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(4) ආරක්ෂිතව පිරිස් යෙදවීමේ නියමයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් අයිතිකරුවකු විසින් හෝ අයිතිකරුවකු විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර -

(අ) යෝජිත පිරිස් යෙදවීමේ මට්ටම නිශ්චය කර ඇත්තේ කෙසේ ද ;

(ආ) එමගින් මාර්ගෝපදේශ සැලකිල්ලට ගනු ලබන්නේ කෙසේ ද; සහ

(ඇ) එමගින් වෙහෙස ඇතුළුව වැඩ කරන පැය ගණන පිළිබඳ විධිවිධාන සැලකිල්ලට ගනු ලබන්නේ කෙසේ ද,

යන්න පිළිබඳ පැහැදිලි සහ සංක්ෂිප්ත පැහැදිලි කිරීමක් ද, ඊට ඇතුළත් විය යුතු ය.

(5) සම්මුතිය නොවන යාත්‍රාවක උපකරණවල, ඉදි කිරීමෙහි හෝ භාවිතයෙහි යම් වෙනසක් සිදු වූ අවස්ථාවක, එහි ආරක්ෂක පිරිස් යෙදවීමේ මට්ටමට බලපෑමක් සිදු විය හැකි නම් එහි අයිතිකරු හෝ ක්‍රියාකරු විසින් නියමයන් නැවත නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) යාත්‍රාවක වෙළඳ ප්‍රදේශය හෝ ප්‍රදේශ ඉදි කිරීම, යන්ත්‍ර සූත්‍ර, උපකරණ මෙහෙයුම් හෝ නඩත්තු කිරීමේ ක්‍රමවේදය වෙනස් වූ විටක දී, අලුත් යෝජනාවක් ඉදිරිපත් කිරීමට අයිතිකරුවකු හෝ ක්‍රියාකරුවකු අපොහොසත් වන අවස්ථාවක, නැතහොත් 18 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ සඳහන් විවේක පැය ගණන පිළිබඳ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට යාත්‍රාවක් විසින් අඛණ්ඩව අපොහොසත් වන අවස්ථාවක, යාත්‍රාවක ආරක්ෂක පිරිස් යෙදවීමේ මට්ටම අවලංගු කරනු ලැබිය හැකි ය.

18. (1) නෞකාධිපතිවරයකු විසින්, සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් දුරට, වැඩ ආරම්භ කරන අවස්ථාව වන විට තමා සහ සියලු ම නාවික පිරිස් සාමාජිකයන් නිසි පරිදි විවේක ගෙන ඇති බවට ද, රාජකාරියේ නොයෙදෙන විට ප්‍රමාණවත් විවේකයක් ලබා ගන්නා බවට ද, වගබලා ගනු ලැබිය යුතු ය.

(2) නෞකාස්ථව සේවයේ නියුක්ත යම් තැනැත්තකුගේ අවම විවේක පැය ගණන :-

(අ) පැය 24ක කාලසීමාවක් තුළ පැය දහයකට; සහ

(ආ) දින හතක කාලසීමාවක් තුළ පැය හැත්තෑ හතකට,

නොඅඩු විය යුතු ය.

(3) නෞකාධිපතිවරයකු සහ නාවික පිරිසේ සාමාජිකයන් අතර, ගිවිසගෙන ඇති තාක් දුරට, ඔවුන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහ යාත්‍රාවේ ආරක්ෂාව ඉන් අනතුරට පත් නොවන්නේ නම්, ව්‍යතිරේක සඳහා අවසර ලැබෙන්නේ ය. එම ව්‍යතිරේක මුරකාවලෙහි යෙදෙන මුහුදු යාත්‍රාකරුවන් හෝ කෙටි මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් සඳහා වඩාත් නිරන්තර වූත් වඩාත් දීර්ඝ වූත් නිවාඩු කාලසීමාවක් හෝ හානිපූරක නිවාඩු ලබා දීම සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

19. (1) මුරකාවලෙහි යෙදීමේ වැඩපිළිවෙළ අනුව මෙහෙයවනු ලබන යාත්‍රා සඳහා, වැඩ කරන පැය ගණන සහ විවේක කාලසීමාවන් දක්වමින්, නෞකාධිපතිවරයකු විසින් රාජකාරී කාල සටහනක් සකස් කරනු ලැබිය යුතු ය.

(2) කාල සටහනක් සකස් කිරීමේ දී, නෞකාධිපතිවරයකු විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) මෙහෙයුම් වර්ගය;

(ආ) මුරකාවලෙහි යෙදීමේ වැඩපිළිවෙළ පිළිබඳ විස්තර;

(ඇ) මුළු වැඩ ප්‍රමාණය; සහ

(ඈ) අක්‍රමවත් වැඩ කරන පැය ගණනක ඇති බරපතළ බව සහ එය වෙහෙස ඇති කිරීමට දක්වන දායකත්වය සහ සාධාරණ ලෙස ස්ථාවර වූ වැඩකරන පැය ගණනක් කාල සටහන්ගත කිරීමේ වැදගත්කම.

(3) නෞකාධිපතිවරයකු විසින්, යාත්‍රාවක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක, යාත්‍රා කරන මුරකාවල භාරව උචිත සහතිකලත් තැනැත්තකු සෑම විට ම සිටින බවට වගබලා ගනු ලැබිය යුතු ය.

## VI වන කොටස

*භාණ්ඩ ප්‍රවාහනය - සහ යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව*

20\. (1) සම්මුතිය නොවන යාත්‍රාවල භාණ්ඩ ප්‍රවාහනය 2022 ජනවාරි මස 6 වන දින අංක 2262/55 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 7 දරන වෙළඳ නැව් (භාණ්ඩ සහ තෙල් ඉන්ධන ප්‍රවාහන) නියෝගවල විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(2) සම්මුතිය නොවන යාත්‍රාවල අන්තරායදායක භාණ්ඩ ප්‍රවාහනය 2022 ජනවාරි මස 6 වන දින අංක 2261/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 8 දරන වෙළඳ නැව් (අන්තරායක භාණ්ඩ ප්‍රවාහනය) නියෝගවල විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(3) යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව සහ යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව සඳහා වන උපකරණ සම්බන්ධයෙන් වන විට, සම්මුතිය නොවන යාත්‍රාවක් විසින්, 2022 ජනවාරි මස 6 වන දින අංක 2261/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 6 දරන වෙළඳ නැව් (යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව) නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

*මෙහෙයුම් නියමයන්*

21\. සම්මුතිය නොවන යාත්‍රාවක නෞකාධිපතිවරයකු විසින් :-

(1) සෑම විටදී ම ආරක්ෂිත සහ පාලනය කළ ආකාරයකින් යාත්‍රාව යාත්‍රා කරන බවට සහ සමීක්ෂණ සහතිකයේ සියලු කොන්දේසි පිළිපදින බවට;

(2) සෑම විටදී ම අදාළ ස්ථායීතා නියමයක් පිළිපදින බවට;

(3) සෑම මුහුදු ගමනක්ම ආරම්භ කිරීමට පෙර සහ වරායකට ඇතුළු වීමට පෙරාතුව නෞකාව පැදවීමේ උපකරණ, නෞකාව හැසිරවීමේ උපකරණ සහ සන්නිවේදන පද්ධති පරීක්ෂා කරන බවට;

(4) යාත්‍රාවේ බඳේ ඇති සියලු ම කවුළු සහ විවර ඒවා භාවිත කරන විට දී හැර තදින් වසා තබා ඇති බවට; සහ

(5) මැදිරි අතර මාරුවීම සඳහා භාවිත කරන විට දී හැර, යාත්‍රාව යාත්‍රා කරන කාලය තුළ යාත්‍රාවෙහි කාමර අනු බෙදුමෙහි ඇති සියලු ම ජල පරිරෝධක දොරවල් තදින් වසා ඇති බවට,

වගබලා ගනු ලැබිය යුතුය;

එසේ වුව ද, නෞකාධිපතිවරයකු විසින්, සහතිකයේ නියම කර ඇති ගමන් මාර්ගය වෙනස් කිරීම හෝ විපතට පත් යාත්‍රාවලට සහාය වීම සඳහා නැතහොත් වෙනත් හදිසි අවස්ථා සඳහා අවශ්‍ය බවට පෙනී යන සහ විචක්ෂණශීලී බවට සලකනු ලබන වෙනත් පියවර ගැනීම හෝ කරනු ලැබිය හැකි ය.

22\. (1) සමුද්‍රීය හදිසි අනතුරකට සම්බන්ධ යාත්‍රාවක අයිතිකරුවකු, නියෝජිතයකු, නෞකාධිපතිවරයකු හෝ එය භාරව සිටින තැනැත්තකු විසින්, හදිසි සමුද්‍රීය අනතුරක දී එම අනතුර පහත සඳහන් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් වන විට, ඒ සම්බන්ධයෙන් හැකිතාක් ඉක්මනින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය:-

(අ) යාත්‍රාකරණයට, පරිසරයට හෝ යාත්‍රාවේ ආරක්ෂාවට අන්තරායක් ඇති කරන යම් බිම් ගැන්වීමක් හෝ ගැටීමක්;

(ආ) ප්‍රධාන ධාවන, ප්‍රචාලන යන්ත්‍ර, නෞකාව පැදවීමේ මූලික උපකරණ හෝ ඒ හා සම්බන්ධ යම් කොටසක නැති වීමක්;

(ඇ) යාත්‍රාව හැසිරවීමේ හැකියාව අඩු කිරීමට හේතු වන, නෞකා පාලන පද්ධතියෙහි නැති වීමක්;

(ඈ) යාත්‍රාවේ මුහුදු යෝග්‍යතාවට හෝ සේවය හෝ ගමන් මාර්ගය සඳහා වන යෝග්‍යතාවට සැලකිය යුතු ලෙස සහ අහිතකර ලෙස බලපාන යම් සිදුවීමක දී ඊට ගිනි, ජල ගැලීම්, ස්ථාවර ගිනි නිවීමේ පද්ධති, ජීවිතාරක්ෂක උපකරණ, අතුරු බලශක්ති උත්පාදන උපකරණ හෝ බිල්ජ් (bilge) පොම්ප පද්ධති ක්‍රියාවිරහිත වීම හෝ ඒවාට හානිවීම ඇතුළත් වන නමුත් එය ඊට සීමා නොවන්නේ ය;

(ඉ) ජීවිත අහිමි වීමක්;

(ඊ) ප්‍රථමාධාර ඉක්මවා ගිය වෘත්තීය වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන්නා වූ ද, වාණිජ සේවාවල යෙදෙන යාත්‍රාවක නෞකාස්ථව සේවය කරන හෝ සේවයේ නියුක්තව සිටින තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එකී තැනැත්තා එකී යාත්‍රාවේ සාමාන්‍ය කාර්ය කිරීමට නුසුදුසු තැනැත්තකු බවට පත් කරන්නා වූ ද, තුවාල සිදුවීමක්; හෝ

(උ) එකී දේපළ සේවයට සුදුසු තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රමය සහ ද්‍රව්‍ය පිරිවැය ඇතුළුව තක්සේරුව ඇ.ඩො. 10,000 ක් ඉක්මවන අලාභයක් යම් දේපළකට ඇති කරන්නා වූ සිදුවීමක්.

(2) (1) වන අනුනියෝගයේ නියම කර ඇති දැන්වීමක් අදාළ යාත්‍රාවේ හෝ යාත්‍රාවල නම සහ හඳුනාගැනීමේ අංකය, යාත්‍රාවේ අයිතිකරුගේ හෝ නියෝජිතයාගේ නම, හදිසි අනතුරේ ස්වභාවය සහ ඊට අදාළ අවස්ථානුගත කරුණු, එය සිදු වූ ප්‍රදේශය සහ පුද්ගල හානිවල සහ දේපළ අලාභ හානිවල ස්වභාවය සහ ප්‍රමාණය ඇතුළත් විය යුතු ය.

(3) අනුනියෝගයෙන් නියම කර ඇති දැන්වීමට අමතරව, යාත්‍රාවක අයිතිකරුවකු, නෞකාධිපතිවරයකු, නියෝජිතයකු හෝ යාත්‍රාව භාරව සිටින තැනැත්තකු විසින්, දින තුනක් ඇතුළත, මේ නියෝගවල IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ වාර්තා කිරීමේ ආකෘති පත්‍ර භාවිත කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විස්තර ලබා දෙනු ලැබිය යුතු ය.

23. (1) සෑම යාත්‍රාවක් විසින් ම නිල ලොග් පොතක් නෞකාස්ථව පවත්වාගෙන යනු ලැබිය යුතු ය. නෞකාධිපතිවරයකු විසින් පහත දැක්වෙන සටහන් එකී ලොග් පොතට ඇතුළත් කරනු ලැබිය යුතු ය; ඇතුළත් කර තිබිය යුතු ය:-

(අ) යටත් පිරිසෙයින් සෑම පැය හතරකට වරක් ගමන් මාර්ගය, කාලගුණ තත්ත්වය ඇතුළුව මුහුදු ගමන පිළිබඳ විස්තර සහ මේ කොටසෙහි (vii වන කොටස) නියම කර ඇති පරීක්ෂණ;

(ආ) සමුද්‍රීය හදිසි අනතුරක් සිදු වූ අවස්ථාවක, එසේ කිරීම ප්‍රායෝගික වන්නේ නම්, එකී සමුද්‍රීය හදිසි අනතුරක් සිදු වූ වහාම, එම හදිසි අනතුර සහ එය සිදුව ඇත්තේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද, එම අවස්ථානුගත කරුණු පිළිබඳ ප්‍රකාශයක්;

(ඇ) නෞකාස්ථව සිදු වූ එක් එක් මරණයක් සහ එකී මරණයට හේතුව;

(ඈ) මිය යාම හේතුවෙන් හැර නාවික පිරිසේ සාමාජිකයකු වීම අවසන් වූ එක් එක් මුහුදු යාත්‍රාකරුවකුගේ නම සහ එකී මුහුදු යාත්‍රාකරු නාවික පිරිසේ සාමාජිකයකු වීම අවසන් වූ වේලාව, ස්ථානය, ආකාරය සහ හේතුව; සහ

(ඉ) මේ නියෝගවලින් නියම කර ඇති සරඹ පුහුණු සහ පුහුණු පිළිබඳ විස්තර.

(2) අතහැර දැමූ නෞකාවක්, මුහුදට වැටුණු තැනැත්තන් සහ ගිනි සරඹ පුහුණු සම්බන්ධයෙන් (1) වන අනුනියෝගයෙන් නියම කර ඇති ලොග් සටහනට පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතු ය:-

(අ) සරඹ පුහුණුව සහ පුහුණුව සිදු කළ දිනය; සහ

(ආ) සරඹ පුහුණුවේ තත්ත්වය සහ පුහුණුවට අදාළ තේමා පිළිබඳ සාමාන්‍ය විස්තරයක්.

24. මගීන් නෞකාස්ථව සිටින විට, නෞකාධිපතිවරයා විසින්, සෙල්සියස් අංශක 43.3ක (ෆැරන්හයිට් අංශක 110ක) ජ්වලනාංකයක් ඇති ඉන්ධන නෞකාස්ථව රැගෙන යනු නොලැබිය යුතු ය.

25. ස්වයංක්‍රීය නියමුවකු භාවිත කරන කවර වූ හෝ අවස්ථාවක, නෞකාධිපතිවරයකු විසින් :-

(අ) නෞකාව හැසිරවීමේ උපකරණ සැමවිටම ක්ෂණිකව ම අතින් පාලනය ස්ථාපනය කළ හැකි බවට; සහ

(ආ) සැමවිටම නෞකාව පැදවීමේ උපකරණ පාලනය කිරීම භාර ගැනීමට සමත් තැනැත්තකු සූදානම් ව සිටින බවට; සහ

(ඇ) නෞකාව පැදවීමේ උපකරණ ස්වයංක්‍රීයව පාලනය කිරීමේ සිට අතින් පාලනය කිරීමට මාරු කිරීම හෝ අතින් පාලනය කිරීමේ සිට ස්වයංක්‍රීයව පාලනය කිරීමට මාරු කිරීමේ දී නෞකාධිපතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ නිලධරයාගේ අධීක්ෂණය යටතේ එය සිදු කරන බවට,

වගබලා ගනු ලැබිය යුතු ය.

26. (1) මුහුදු ගමනක යෙදෙන යාත්‍රාවක අයිතිකරුවකු, නෞකා කුලියට දෙන්නකු, ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින්:-

(අ) නම් සහ ස්ත්‍රී පුරුෂභාවය ඇතුළුව, වැඩිහිටියන්, ළමයින් සහ ළදරුවන් වෙන් කොට දක්වමින්, යාත්‍රාවට නගින සහ යාත්‍රාවෙන් බසින සියලු ම තැනැත්තන් පිළිබඳ නිවැරදි වාර්තාවක් තබා ගනු ලැබිය යුතු ය;

(ආ) යාත්‍රාවට නගින සහ යාත්‍රාවෙන් බසින මුළු මගීන් ගණන නිවැරදිව සහ ලිඛිතව තබා ගනු ලැබිය යුතු ය. මුහුදු ගමනක් ආරම්භ කිරීමට පෙරාතුව එකී මගීන් ගණන ගොඩබිම්මෙහි හොඳින් සලකුණු කළ ස්ථානයක හෝ යාත්‍රාවේ අයිතිකරුගේ හෝ කළමනාකාර ක්‍රියාකරුගේ නියෝජිතයකු සමඟ සන්ධානය කරනු ලැබිය යුතු ය.

27. (1) මගීන් රැගෙන යන මුහුදු ගමනක් ආරම්භ කිරීමට පෙර, යාත්‍රාවක නෞකාධිපතිවරයකු විසින්, යාත්‍රාවේ මෙහෙයුම්වලට සහ වැඩපිළිවෙළට අදාළ පහත දැක්වෙන කරුණු සියලු ම මගීන් වෙත දන්වමින් සුදුසු ප්‍රසිද්ධ නිවේදන නිකුත් කිරීම සඳහා වගබලා ගනු ලැබිය යුතු ය:-

(අ) හදිසි අවස්ථා කාර්යපටිපාටි පිළිබඳ සාමාන්‍ය පැහැදිලි කිරීමක්;

(ආ) හදිසි අවස්ථා පිටවීමේ දොරටු සහ ගැලවීමේ යාත්‍රා ගොඩබෑමේ ප්‍රදේශ;

(ඇ) ජීවිතාරක්ෂක ජැකට්ටු ගබඩා කර ඇති ස්ථානය;

(ඈ) ජීවිතාරක්ෂක ජැකට්ටුවක් නිසියාකාරව ඇඳගැනීම පිළිබඳ ආදර්ශකයක් ඇතුළුව, යාත්‍රාවක් රැගෙන යන වර්ගයට අයත් ජීවිතාරක්ෂක ජැකට්ටු පළඳින සහ උචිත ලෙස සකසා ගන්නා නිවැරදි ක්‍රමය;

(ඉ) ජීවිතාරක්ෂක ජැකට්ටු සහ අනෙකුත් ජීවිතාරක්ෂක උපකරණ භාවිතය සම්බන්ධයෙන් වන උපදෙස් ඇතුළත් දැන්වීම ඇති ස්ථානය; සහ

(ඊ) අන්තරාදායක විය හැකි තත්ත්වයක් ඇති විට, නෞකාධිපතිවරයා විසින් විධාන කරනු ලබන පරිදි සියලු ම මගීන් විසින් ජීවිතාරක්ෂක ජැකට්ටු පැළඳිය යුතු බව.

(2) (1) වන අනුනියෝගයට අනුකූලව වූ නිවේදනයකට විකල්පයක් ලෙස, නෞකාධිපතිවරයකු හෝ වෙනත් නම් කරන ලද තැනැත්තකු විසින් :-

(අ) මුහුදු ගමනක් ආරම්භ කිරීමට පෙරාතුව, (1) වන අනුනියෝගයේ ලැයිස්තුගත කර ඇති තොරතුරු ඇතුළත් කාඩ්පතක් හෝ පත්‍රිකාවක් යාත්‍රාවේ සියලු ම මගීන්ට ලබා දෙනු ලැබිය හැකි අතර, වාහන රැගෙන නොයන සහ එක් එක් මගියා සඳහා ආසන ඇති යාත්‍රා සම්බන්ධයෙන් වන විට, එම එක් එක් ආසනය අසල එකී කාඩ්පත හෝ පත්‍රිකාව තබනු ලැබිය හැකි ය; සහ

(ආ) පහත දැක්වෙන දේ ඇතුළත් කෙටි නිවේදනයක් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(i) හදිසි අවස්ථාවක දී මගීන් විසින් නාවික පිරිස ලබා දෙන උපදෙස් අනුගමනය කළ යුතු බවට වූ ප්‍රකාශයක්;

(ii) ජීවිතාරක්ෂක ජැකට්ටු තබා ඇති ස්ථානය; සහ

(iii) ජීවිතාරක්ෂක ජැකට්ටු ඇඳගැනීම, හදිසි අවස්ථාවක දී භාවිත කළ යුතු අනෙකුත් උපකරණ තබා ඇති ස්ථානය සහ හදිසි මුදා ගැනීමේ කාර්ය පටිපාටි ඇතුළු හදිසි අවස්ථා කාර්ය පටිපාටි පිළිබඳ වැඩිදුර තොරතුරු එක් එක් මගියාට ලබා දී ඇති හෝ නැතහොත් එක් එක් ආසනය අසල තබා ඇති කාඩ්පතෙහි හෝ පත්‍රිකාවෙහි ඇතුළත් වන බව.

(3) යාත්‍රාවට අනන්‍ය වූ මෙහෙයුම හේතුවෙන් නිවේදන නිකුත් කිරීම ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, මිනිත්තු පහළොවකට අඩු කාලයක කෙටි මුහුදු ගමන්වල යෙදෙන මගී යාත්‍රා විසින්, (1) වන සහ (2) වන අනුනියෝගවල නියම කර ඇති නිවේදනය වෙනුවට නිවාරක පුවරු දැන්වීම් හෝ සංඥා ආදේශ කරගනු ලැබිය හැකි ය.

(4) පැය දොළහකට වැඩි කාලයක මුහුදු ගමනක යෙදෙන යාත්‍රාවක, පවත්වනු ලබන ආරක්ෂක හැඳින්වීමක දී ජීවිතාරක්ෂක ජැකට්ටු පැළඳීම සහ යාත්‍රාවට නැගීමේ අදාළ ස්ථානයට යෑම සඳහා එහි මගීන්ට උපදෙස් දෙනු ලැබිය යුතු ය. මුල් පෙරෙට්ටුව පැවැත්වීමෙන් පසුව සුළු මගීන් සංඛ්‍යාවක් පමණක් යම් වරායක දී යාත්‍රාවට නගිනු ලැබූ අවස්ථාවක, තවත් පෙරෙට්ටුවක් පවත්වනු නොලබන්නේ නම්, එම මගීන්ට (1) වන සහ (2) වන අනුනියෝගවලින් නියම කර ඇති මගී ආරක්ෂක හැඳින්වීම ලබා දිය යුතු ය.

(5) පහත දක්වෙන තත්ත්වයන් ඇතුළුව එහෙත් ඊට සීමා නොවූ අන්තරාදායක විය හැකි අවස්ථාවක යාත්‍රාවක නෞකාධිපතිවරයකු විසින්, ජීවිතාරක්ෂක ජැකට්ටු පළඳින ලෙස මගීන්ට නියම කරනු ලැබිය යුතු ය:-

(අ) අන්තරාදායක හරස්වැලිපර සහ කලපු හරහා ගමන් කරන විට;

(ආ) දැඩි කාලගුණික තත්ත්වයක දී;

(ඇ) ජල ගැලීම, ගිනි හෝ මුදාගැනීමක් සිදු කිරීමට අවශ්‍ය විය හැකි වෙනත් සිද්ධි ඇතිවිට දී; සහ

(ඈ) යාත්‍රාව ඇදගෙන යන විට.

(6) හදිසි අවස්ථාවක දී ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න දැන ගැනීමට මගීන්ට හැකියාව ලබා දීම සඳහා ප්‍රමාණවත් හදිසි අවස්ථා උපදෙස් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(7) හදිසි අවස්ථාවක දී ජීවිතාරක්ෂක ජැකට්ටු ඇඳගැනීමට මගීන්ට හැකියාව ලබා දීම සඳහා ජීවිතාරක්ෂක ජැකට්ටු ඇඳිය යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් ප්‍රමාණවත් උපදෙස් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(8) යාත්‍රාවක නෞකාධිපතිවරයකු සහ නාවික පිරිස ගින්නක්, රළු කාලගුණයක් හෝ මිනිසුන් මුහුදට වැටී ඇති තත්ත්වයක් ඇති වූ විට දී ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් හදිසි අවස්ථා උපදෙස්වල අන්තර්ගතය සම්බන්ධයෙන් හුරු විය යුතු ය. එහි උපදෙස් මෙහෙයුම් ස්ථානයේ තිබිය යුතු ය.

(9) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මාර්ගෝපදේශ ලෙස ලබා දෙන නිර්දේශිත ආකෘතියෙන් වූ නියමිත තොරතුරු ඇතුළත් හදිසි අවස්ථා උපදෙස් පුවරුවක් (6) වන අනුනියෝගයේ නියමයන් සපුරා ලන්නේ ය.

(10) යාත්‍රාවක් මෙහෙයවීමෙන් ලැයිස්තුගත කර ඇති අන්තරායන් කිසිවක් ඇති නොවන බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක හැර හදිසි අවස්ථා උපදෙස් පුවරුවක යටත් පිරිසෙයින්, මේ නියෝගවල V වන උපලේඛනයේ සඳහන් "හදිසි අවස්ථා උපදෙස්" වල අදාළ කොටස් අන්තර්ගත විය යුතු ය. එක් එක් යාත්‍රාවේ උපකරණ, වැඩපිළිවෙළ සහ මෙහෙයුම සැලකිල්ලට ගනිමින් හදිසි අවස්ථා උපදෙස් සකස් කළ යුතු ය.

(11) යාත්‍රාව තුළ සවි කිරීමට සුදුසු ස්ථානයක් නොමැති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, හදිසි අවස්ථා උපදෙස් ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය නොවන අතර එය යාත්‍රාව තුළ තිබිය යුතු අතර, නාවික පිරිසට එයට හුරුවීමට සැලැස්විය යුතු ය.

(12) දිග මීටර් 24 කට වැඩි වූ ද, එක් වරක දී නෞකාධිපතිවරයා ඇතුළුව නාවික පිරිසේ සාමාජිකයන් සිව්දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සිටිය යුතු වූ ද, යාත්‍රාවක, නෞකාධිපතිවරයා විසින්, එහි මෙහෙයුම් ස්ථානයේ සහ නාවික පිරිස නවාතැන් ගන්නා එක් එක් ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක පෙරෙට්ටු ලැයිස්තුවක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(13) 12 වන අනුනියෝගයේ නියම කරන ලද පෙරෙට්ටු ලැයිස්තුවේ විවිධ හදිසි අවස්ථා සම්බන්ධයෙන් නාවික පිරිසේ එක් එක් සාමාජිකයා සතු විශේෂ කාර්ය සහ සේවා ස්ථානය දැක්විය යුතු ය. එකී කාර්ය, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, අදාළ තැනැත්තාගේ සාමාන්‍ය කාර්යයට අනුකූල විය යුතු ය. එකී කාර්යයන්ට, යම් නිශ්චිත හදිසි අවස්ථාවක් නිසි පරිදි පාලනය කිරීම සඳහා අවශ්‍ය වෙනත් කාර්යයන්ට අමතරව අවම වශයෙන් පහත දැක්වෙන කාර්ය ද ඇතුළත් විය යුතු ය:-

(අ) නැව් කවුළු, වායු සිදුරු, ජල පරිරෝධක දොරවල්, වාදොර, දියකවුළු යන නැව් බඳ විනිවිද යන වූෂණ වැල්ව සහ විසර්ජන නළ වසා දැමීම, විදුලි පංකා සහ සංවාතන පද්ධති සියලු ම ආරක්ෂණ උපකරණ ක්‍රියාත්මක කිරීම.

(ආ) ගලවා ගැනීමේ යාත්‍රා සහ මුදවා ගැනීමේ බෝට්ටු සූදානම් කිරීම සහ දියත් කිරීම;

(ඇ) ගිනි නිවාරණය; සහ

(ඈ) පහත දැක්වෙන දෑ ඇතුළුව මගීන් පෙරෙට්ටු කිරීම:-

(i) මගීන්ට අනතුරු ඇඟවීම;

(ii) මගීන් රැස්කර ඔවුන් නියමිත ස්ථානවලට යොමු කිරීම; සහ

(iii) කොරිඩෝ සහ තරප්පු පේළිවල නිසි පිළිවෙළ පවත්වා ගැනීම සහ සාමාන්‍යයෙන් මගී සංචලනය පාලනය කිරීම.

28. (1) නෞකාව අත්හැර දැමීමට, මුහුදට වැටුණු තැනැත්තන් සොයා ගැනීමට අවශ්‍ය වීම වැනි හදිසි අවස්ථාවන්වල දී සහ නෞකාස්ථ ගින්නක් ඇති වූ විට නාවික පිරිසේ සියලු සාමාජිකයන් ඔවුන් විසින් කළ යුතු කාර්ය සම්බන්ධයෙන් සිය රාජකාරියට හුරු කරවීම වගබලා ගැනීම සඳහා ප්‍රමාණවත් උපදෙස් දීම සඳහා නෞකාධිපතිවරයා විසින් පුහුණු සහ සරඹ අභ්‍යාස පවත්වනු ලැබිය යුතු ය.

(2) නෞකාධිපතිවරයකු විසින්, මගී යාත්‍රාවල සෑම මසකට වරක් ද, අනෙකුත් සියලු ම යාත්‍රාවල සෑම මාස දෙකකට වරක් ද, නෞකාව අත්හැර දැමීමේ එක් සරඹ පුහුණුවක් සහ එක් ගිනි සරඹ පුහුණුවක් පවත්වනු ලැබිය යුතු ය.

(3) පසුගිය මාසයේ යාත්‍රාවේ නාවික පිරිසෙන් 25% කට වැඩි සංඛ්‍යාවක් නෞකාස්ථ සරඹ පුහුණුවකට සහභාගී වී නොමැති අවස්ථාවක, නෞකාවේ වර්ගය කුමක් වුව ද, නෞකාධිපතිවරයකු විසින්, එකී නාවික පිරිසේ වෙනස් කිරීම සිදු වීමෙන් පැය හතලිස් අටක් ඇතුළත නෞකාවක් අත්හැර දැමීමේ සරඹ පුහුණුවක් සහ ගිනි සරඹ පුහුණුවක් පවත්වනු ලැබිය යුතු ය.

(4) සෑම නෞකාවක් අත්හැර දැමීමේ සරඹ පුහුණුවක් ම, ප්‍රායෝගිකව හැකි තාක් දුරට, සත්‍ය වශයෙන් ම හදිසි අවස්ථාවක් උද්ගතව ඇති විටක දී මෙන් සිදු කරනු ලැබිය යුතු අතර, ඊට පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු ය:-

(අ) නෞකාවක නාවික පිරිසට නියමිත ස්ථානවලට වාර්තා කර, ඔවුන්ට පවරන ලද කාර්ය සඳහා සූදානම් වන ලෙස අණ කිරීම;

(ආ) රාත්‍රී මුහුදු ගමනක යෙදෙන යාත්‍රාවක මගීන් පෙරෙට්ටු ස්ථානවලට හෝ යාත්‍රාවට නැගීමේ ස්ථානවලට කැඳවා, නෞකාව අත්හැර දැමීමේ නියෝගය නිකුත් කරනු ලබන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීමට වගබලා ගැනීම;

(ඇ) ජීවිතාරක්ෂක ජැකට්ටු නිවැරදිව ඇඳ ඇත්දැයි පරීක්ෂා කිරීම; සහ

(ඈ) ගලවා ගැනීමේ යාත්‍රා ස්වයංක්‍රීයව සහ අතින් යෙදවීම පිළිබඳ උපදෙස්.

(5) මුදවා ගැනීමේ බෝට්ටු ලබා දී ඇති අවස්ථාවක, එකී සෑම මුදවා ගැනීමේ බෝට්ටුවක් ම -

(අ) එසේ කිරීම ප්‍රායෝගික හා සාධාරණ වන අවස්ථාවක, සෑම මසකට වරක් ම; එහෙත්

(ආ) යාත්‍රාව මගීන් සමග යාත්‍රා කිරීම ආරම්භ කිරීමට පෙරාතුව වූ මාස තුනක කාලසීමාව ඇතුළත යටත් පිරිසෙයින් එක් වරක්වත්,

සත්‍ය වශයෙන් ම මිනිසුන් මුහුදට වැටී ඇති අවස්ථාවක දී මෙන් එහි නියම නාවික පිරිස සමග දියත් කර, ජලයේ හසුරුවනු ලැබිය යුතු ය.

(6) සෑම ගිනි සරඹ පුහුණුවක් ම, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, සත්‍ය වශයෙන් ම හදිසි අවස්ථාවක් උද්ගතව ඇති විටක මෙන් සිදු කරනු ලැබිය යුතු අතර, ඊට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතු ය:-

(අ) නාවික පිරිසට නියමිත ස්ථානවල වාර්තා කර, ඔවුන්ට පවරන ලද කාර්ය සඳහා සූදානම් වී එකී කාර්ය ආදර්ශනය කරන ලෙස අණ කිරීම;

(ආ) රාත්‍රී මුහුදු ගමනක යෙදෙන යාත්‍රාවක මගීන් පෙරෙට්ටු ස්ථානවල හෝ යාත්‍රාවට නැගීමේ ස්ථානවලට යෙදවීම සඳහා; සහ

(ඇ) ගිනි ඇණවුම්, ගිනි නිවාරණ උපකරණ සහ වෙනත් නෞකාස්ථ ගිනි නිවීමේ උපකරණ භාවිත කිරීම සහ ඒවා ඇති ස්ථාන පිළිබඳ උපදෙස්.

29. අයිතිකරුවකු සහ නෞකාධිපතිවරයකු විසින්, සෑම යාත්‍රාවක ම පහත දැක්වෙන සලකුණු යොදා ඇති බවට වගබලා ගනු ලැබිය යුතු ය:-

(අ) සියලු ජීවිතාරක්ෂක උපකරණ සහ ගිනි නිවීමේ උපකරණවල යාත්‍රාවේ නම සලකුණු කර තිබිය යුතු ය;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනවශ්‍ය යයි සලකනු ලබන්නේ නම් මිස, සියලු ගැලවී යාමේ නැව් කවුළුවල සහ ගැලවීයාමේ ක්‍රමයක් ලෙස භාවිත කරන අනෙකුත් හදිසි අවස්ථා පිටවීමේ දොරටුවල දෙපැත්තේ ම යටත් පිරිසෙයින් මි.මී. 50 ක (අඟල් 2 ක) උසකින් "හදිසි අවස්ථා පිටවීමේ දොරටුව, අවහිර නොකරන්න" ලෙස පැහැදිලිව කියවිය හැකි අකුරින් සලකුණු කර තිබිය යුතු ය;

(ඇ) දුරස්ථ ඉන්ධන ප්‍රවාහය නැවැත්වීමේ ස්ථානවල යටත් පිරිසෙයින් මි.මී. 25 ක් (අඟල් 1 ක) උසකින් වෑල්වයේ අරමුණු සහ ක්‍රියාත්මක කිරීමේ උපදෙස් පැහැදිලිව කියවිය හැකි අකුරින් සලකුණු කර තිබිය යුතු ය; සහ

(ඈ) එසේ සලකුණු කිරීම අනවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම් මිස, ජල පරිරෝධක දොරවල්වල සහ ජල පරිරෝධක නැව් කවුළුවල දෙපැත්තේ ම යටත් පිරිසෙයින් මි.මී. 25 ක් (අඟල් 1 ක) උසකින් "ජල පරිරෝධක දොර - වසා තබන්න" ලෙස හෝ "ජල පරිරෝධක නැව් කවුළුව - වසා තබන්න" ලෙස හෝ පැහැදිලිව කියවිය හැකි අකුරින් සලකුණු කර තිබිය යුතු ය.

30. ස්ථාවර වායු ගිනි නිවාරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්පූර්ණ එහෙත් සරල උපදෙස් එක් එක් ඇඳීමේ කොටු සහ නැවැත්වීමේ වෑල්ව පාලකයන් නැතහොත් ඒ අසල හෝ ගිනි නිවාරණ කාරක අඩංගු සිලින්ඩර ගබඩා කර ඇති ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක දක්වා තිබිය යුතු ය.

31. (1) යාත්‍රාවක ඇති සෑම දියත් කිරීමේ උපකරණයක් ම, සෑම ගලවා ගැනීමේ යාත්‍රාවක් ම සහ මුදවා ගැනීමේ බෝට්ටුවක් ම යාත්‍රාව වරායෙන් පිටත් වීමට පෙර සහ යාත්‍රාව ගමන් කරන සෑම විටදී ම හොඳින් ක්‍රියාකළ හැකි තත්ත්වයකින් තිබිය යුතු ය.

(2) ගලවා ගැනීමේ යාත්‍රා සහ මුදවා ගැනීමේ බෝට්ටු තබා ඇති සහ ගොඩකර ඇති සෑම නැව් තට්ටුවක් ම එකී ගලවා ගැනීමේ යාත්‍රා සහ මුදවා ගැනීමේ බෝට්ටු යාත්‍රාවට ගොඩ කිරීමට හා දියත් කිරීමට අවහිර විය හැකි බාධාවලින් තොරව පවත්වා ගනු ලැබිය යුතු ය.

(3) සියලු ම ජීවිතාරක්ෂක උපකරණ මේ නියෝගවලට සහ නිෂ්පාදකයාගේ උපදෙස්වලට අනුකූලව පවත්වා ගනු ලැබිය යුතු ය.

32. (1) නෞකාවේ සියලු ම නෞකාස්ථ උපකරණ සහ යන්ත්‍රසූත්‍ර සඳහා උපදෙස් සංග්‍රහ ඇති බවට නෞකාවක අයිතිකරු විසින් වගබලා ගනු ලැබිය යුතු ය.

(2) නෞකාවේ ආරක්ෂාවට සහ මෙහෙයවීමට සහ එහි යන්ත්‍රසූත්‍රවලට සහ උපකරණවලට අදාළ සියලු ම උපදෙස් සංග්‍රහ, සංඥා, දැන්වීම්, සැලසුම් සහ ලේඛන නිල භාෂාවලින් ද අදාළ විට, නාවික වැඩ කරන භාෂාවන්ගෙන් ද විය යුතු ය.

## VIII වන කොටස

*සාමාන්‍ය විධිවිධාන*

33. (1) 2017 මැයි මස 4 වන දින අංක 2017/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) 2017 මැයි මස 4 වන දින අංක 2017/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග යටතේ දැනටමත් කර ඇති සමීක්ෂණ සහතිකයක් එහි වලංගු කාලසීමාව තෙක් වලංගුව පැවතිය යුතු ය. දැනට පවත්නා සහතිකවල වලංගු කාලසීමාව අවසන් වීමෙන් පසු එකී යාත්‍රා මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීම සහ සහතික කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මඟී යාත්‍රා හැර, දැනට පවත්නා අනෙකුත් යාත්‍රා විසින්, මේ නියෝග බලාත්මක වන දින සිට වසර පහක් ගත වන දිනය හෝ දැනට ඇති සමීක්ෂණ සහතිකයේ කාලය අවසන් වන දිනය, යන දින දෙකෙන් මුලින් එළඹෙන කවර වූ හෝ දිනයකට පෙර මේ නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) පවත්නා මඟී යාත්‍රා විසින්, මේ නියෝග බලාත්මක වන දින සිට එක් වසරක් ගතවන දිනය හෝ දැනට ඇති සමීක්ෂණ සහතිකයේ කාලය අවසන් වන දිනය, යන දින දෙකෙන් මුලින් එළඹෙන කවර හෝ දිනයකට පෙර මේ නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) දැනට පවත්නා යාත්‍රා එකී යාත්‍රා මෙහෙයුම්වල පැවතීම ප්‍රකාරව, එකී යාත්‍රා දැනට ක්‍රියාත්මක වන ප්‍රදේශය සඳහා වන ව්‍යුහාත්මක නිර්මාණයට අනුකූලව පිළිගත හැකි ප්‍රමිතියකින් යුතු බවට සලකනු ලැබිය යුතු අතර, 8 වන නියෝගයේ සඳහන් තාක්ෂණික සංග්‍රහයන්හි නිශ්චිතව දක්වා ඇති ඉදි කිරීම සහ ව්‍යුහාත්මක නිර්මාණය පිළිබඳ ප්‍රමිති සපුරාලීමට අවශ්‍ය නොවන්නේ ය.

(6) පවත්නා යාත්‍රාවකට එහි මෙහෙයුම් ප්‍රදේශයේ වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අදාළ තාක්ෂණික සංග්‍රහය පිළිබඳ අදාළ ඇගයීම සහ අනුකූලතාවක් නිශ්චය කිරීම අලුත් මෙහෙයුම් ප්‍රදේශය හේතුවෙන් ඇති වන අවදානම් ඉහළ යාම සහ නෞකාස්ථව රැගෙන යන තැනැත්තන් සංඛ්‍යාවේ සිදුවන යම් වැඩිවීමක් හා සම්බන්ධ අවදානම් මත පදනම්ව සිදු කරනු ලැබිය යුතු ය.

(7) (අ) දැනට පවත්නා සියලු ම යාත්‍රා සතුව තාක්ෂණික සංග්‍රහයන්ට අනුකූල වූ ස්ථායීතා ලේඛන තිබිය යුතු ය;

(ආ) දැනට පවත්නා මඟී යාත්‍රා විසින් මේ නියෝග පළ කිරීමේ දින සිට මාස හයක් ඇතුළත ස්ථායීතා පරීක්ෂණ සහ ලේඛන සම්පූර්ණ කර තිබිය යුතු ය. රැගෙන යනු ලැබිය හැකි මඟීන් සංඛ්‍යාව අදාළ තාක්ෂණික සංග්‍රහයට අනුකූලව ස්ථායීතාව පිළිබඳ කරුණු මෙන්ම ඉඩකඩ පිළිබඳ සීමාවන් මගින් සීමා කරනු ලබන්නේ ය; සහ

(ඇ) දැනට පවත්නා යාත්‍රාවක, දැනටමත් නෞකාස්ථව සපයනු ලැබ ඇත්තා වූ ද, අදාළ සංග්‍රහයේ නියමයන් සපුරනු ලබන්නා වූ ද, ස්ථායීතා ලේඛන (7) (අ) අනුනියෝගයේ නියමය සපුරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

34. මේ නියෝගවල -

"පනත්" යන්නෙන්. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදහස් වේ;

"බෝට්ටුව" යන්නෙන්, දිග මීටර් 24 කට අඩු යාත්‍රාවක් හෝ දළ ටොන් 150 කට අඩු යාත්‍රාවක් අදහස් වේ. එය බෝට්ටුවක්, වායු පරිමන්දක වාහනයක්, රුවල් යාත්‍රාවක්, සුළං පිරවිය හැකි යාත්‍රාවක් ආදිය විය හැකි ය;

"භාණ්ඩ" යන්නෙන්, යාත්‍රාව සඳහා වූ ඉන්ධන, බැලස්ට් (ඝන හෝ ද්‍රව ආකාරයෙන් වූ) නෞකාස්ථව භාවිත කිරීම සඳහා වන පරිභෝජන ද්‍රව්‍ය, බෝට්ටුවේ ස්ථිර උපකරණ කට්ටලය සහ උපකරණ, බෝට්ටුවේ ගබඩා සහ අමතර ගියර, නාවික පිරිස සහ ඔවුන්ගේ පුද්ගලික ගමන් මලු සහ මගීන් සහ ඔවුන්ගේ පුද්ගලික ගමන් මලු සහ ක්‍රියාකාරකම් හා සම්බන්ධ උපකරණ හැර යාත්‍රාවෙන් ප්‍රවාහනය කරනු ලබන අනෙකුත් සියලු ම දේ අදහස් වේ;

"සහතිකකරණ ආයතනය" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සම්මුතිය නොවන නියෝග සහ තාක්ෂණික සංග්‍රහයන් අදාළ වන යාත්‍රා පරීක්ෂා කිරීම (සමීක්ෂණය කිරීම) සහ සහතික කිරීම පවරා ඇති සමාගමක් හෝ වෘත්තීයවේදියකු අදහස් වේ;

"යාත්‍රාව" යන්නට, නෞකාව යන්නෙහි අර්ථය ම තිබිය යුතු ය;

"දේශීය මුහුදු ගමන" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වරායක සිට එකී වරාය වෙත ම නැතහොත් ශ්‍රී ලංකාවේ වෙනත් යම් වරායක් වෙත සිදු කරන මුහුදු ගමනක් අදහස් වේ;

"දැනට පවත්නා යාත්‍රාව" යන්නෙන්, මේ නියෝග බලාත්මක වන දින වන විට ශ්‍රී ලංකාව තුළ දැනටමත් මෙහෙයවීම් සිදුකරනු ලබන යාත්‍රාවක් අදහස් වන අතර, ඊට මේ නියෝග බලාත්මක වන දිනට පෙර ඉදිකර ඇති එහෙත් ශ්‍රී ලංකා ජල තීරයේ ක්‍රියාත්මකව නොමැති යම් යාත්‍රාවක් ඇතුළත් නොවේ;

"දළටොන් ප්‍රමාණය (GT)" යන්නෙන්, 1969 නෞකාවල ටොන් බර මැනීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සහ ටොන් බර සහතිකයේ සඳහන් පරිදි වේ යන්න අදහස් වේ;

"අභ්‍යන්තර ජල තීරය" යන්නෙන්, දේශීය ජල තීරය මනිනු ලබන පාදක රේඛාවේ සිට ගොඩබිම දෙසට වන්නට ඇති සියලු සහ ජල මාර්ග අදහස් වේ;

"ජාත්‍යන්තර මුහුදු ගමන" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත සිදු කරන මුහුදු ගමනක්, එනම්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ වරායක සිට හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ වරායක් වෙත සිදු කරන මුහුදු ගමනක් හෝ වෙනත් යම් රටක වරායක් වෙත හෝ වෙනත් යම් රටක වරායක සිට ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ වරායක් වෙත සිදුකරන මුහුදු ගමනක් අදහස් වේ;

"දිග" යන්නෙන්, නෞකා තලයේ මුදුනේ සිට මනින විට අඩුම වාත්තුව සහිත ගැඹුරු ස්ථානයේ සියයට 85 ක දී ජල රේඛාවක මුලු දිගෙන් සියයට 96 ක් හෝ නැව් බඳේ ඉදිරිපස සිට එම ජල රේඛාවේ සුක්කානමේ මීටෙහි අක්ෂය දක්වා වූ දිග යන දිග දෙකෙන් වැඩි දිග අදහස් වේ. ඇල කළ නැව් කොටස් සහිතව නිර්මාණය කරන ලද බෝට්ටුවක් සම්බන්ධයෙන් වන විට, මේ දිග මනින ජල රේඛාව නිර්මාණයේ ජල රේඛාවට සමාන්තර විය යුතු ය;

"නාවික සැතපුම" යන්නෙන්, මීටර් 1852 ක් අදහස් වේ;

"ශුද්ධ ටොන් ප්‍රමාණය" යන්නෙන්, 1969 නෞකාවල ටොන් බර මැනීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සහ ටොන් බර සහතිකයේ සඳහන් පරිදි වේ;

"සම්මුතිය නොවන යාත්‍රා" යන්නෙන්, IMO සම්මුති අදාළ නොවන යාත්‍රා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යාත්‍රාවේ දළ ටොන් බර හේතුවෙන් අදාළ IMO සම්මුති අදාළ වීමෙන් නිදහස් කර ඇති දේශීය මුහුදු ගමන්වල පමණක් මෙහෙයුම් සිදු කරනු ලබන යාත්‍රා අදහස් වේ. යාත්‍රාවේ දළ ටොන් බර හේතුවෙන් හෝ මෙහෙයුම් ප්‍රදේශය හේතුවෙන් IMO සම්මුතිවල ඇතැම් කොටස් අදාළ වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිදහස් කර ඇත්නම් මිස, එකී කොටස් අදාළ විය යුතු ය;

"P & I" යන්නෙන්, ආරක්ෂණ සහ හානිපූරණ රක්ෂණය අදහස් වේ;

"නියමු බෝට්ටුව" යන්නෙන්, නියමු සේවාවල යෙදෙන හෝ යෙදීමට අදහස් කරන බෝට්ටුවක් අදහස් කරන අතර, "කැපවුණු නියමු බෝට්ටුව" යන්නෙන්, මූලික වශයෙන් නියමු සේවාවල සහ නියමු දිස්ත්‍රික්කයේ බෝට්ටුවල සිට හෝ බෝට්ටු වෙත සේවක පිරිස, ලිපි සහ කුඩා ප්‍රමාණයේ තොග ප්‍රවාහනය කිරීම වැනි විටින් විට භාරගන්නා වෙනත් සේවාවල යෙදන කවර වූ හෝ ප්‍රමාණයක නියමු බෝට්ටුවක් අදහස් වේ;

"නෞකාව" යන්නෙන්, දිග මීටර් 24 කට වැඩි ජලයේ ගමන් කරන යාත්‍රාවක් හෝ දළ ටොන් 150 කට වැඩි යාත්‍රාවක් අදහස් වේ;

"යාත්‍රාව" යන්නෙන්, මේ නියෝගවල අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ නෞකාවක් හෝ බෝට්ටුවක් අදහස් වේ;

"යාත්‍රා කාණ්ඩ" යන්නෙන්, 2024 දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 2417/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2024 වෙළඳ නැව් (යාත්‍රා වර්ගීකරණය කිරීමේ සහ සහතික කිරීමේ) නියෝගවල අර්ථ නිරූපණය කර ඇති පරිදි යම් බෝට්ටුවක් හෝ නෞකාවක් එය භාවිත කිරීමේ අරමුණට අනුකූලව වර්ගීකරණය කිරීම අදහස් වේ;

"වැඩ බෝට්ටුව" යන්නෙන්, ක්‍රීඩා හෝ විනෝදය පිණිස නොවන වෙනත්, කාර්ය සඳහා වාණිජ වශයෙන් භාවිත කරන, සම්මුතිය නොවන යාත්‍රාවක් අදහස් වන අතර, ඊට කැපවුණු නියමු බෝට්ටුවක් ඇතුළත් නොවේ;

## I වන උපලේඛනය

### සම්මුතිය නොවන යාත්‍රා ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය

(5(2) නියෝගය)

සටහන්:

(අ) රෙජිස්ටරය පොදු රෙජිස්ටරයක් වේ.

(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලියාපදිංචි කිරීම පිළිබඳ සාක්ෂියක් මිස හිමිකාරීත්වය පිළිබඳ සාක්ෂියක් නොවේ.

(ඇ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබනතෙක්, යාත්‍රාවක් ලියාපදිංචි කරන ලද යාත්‍රාවක් නොවන අතර ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් නොලබන්නේ ය.

(ඈ) සෑම අවස්ථාවකදීම 1 වන සහ 4 වන කොටස සම්පූර්ණ කළ යුතු ය.

(ඉ) යාත්‍රාව කවර හෝ ආකාරයකින් හෝ වෙනත් යම් රටක කලින් ලියාපදිංචි කර ඇත්නම් 2 වන කොටස සම්පූර්ණ කළ යුතු ය.

(ඊ) තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීමක් සඳහා 3 වන වගන්තිය සම්පූර්ණ කළ යුතු ය.

(උ) මේ ඉල්ලුම් පත්‍රය තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීමක් සඳහා ද? ඔව් ☐ නැත ☐

(ඌ) ඉල්ලුම් පත්‍රය සඳහා වන හේතුව : 1 වන ලියාපදිංචි කිරීම හිමිකාරීත්වය පැවරීම

(එ) බහාලන ලද ගාස්තුව: එ.ජ.ඩො.

| *1 වන කොටස : යාත්‍රාවේ විස්තර* | |
|---|---|
| යාත්‍රාවේ නම :<br>(කැමැත්තේ අනුපිළිවෙල අනුව නම් කිහිපයක් ඇතුළත් කරන්න) | |
| ලියාපදිංචි කළ වරාය : | |
| ගුවන් විදුලි ඇමතුම් සංඥාව : | |
| අදාළ නම් ගුවන් විදුලි බලපත්‍ර අධිකාරියේ නම සහ ලිපිනය : (ඉල්ලුම් පත්‍රයේ පිටපත අමුණනු ලැබිය යුතු ය) | |
| IMO අංකය : | |
| නැව් බඳේ හඳුනා ගැනීමේ අංකය : | |
| යාත්‍රා වර්ගය : | |
| නැව් බඳ ඉදිකර ඇති ද්‍රව්‍යය : | |
| යාත්‍රාවේ දිග : | |

| | |
|---|---|
| දළ ටොන් ප්‍රමාණය : | |
| ශුද්ධ ටොන් ප්‍රමාණය : | |
| ඉදි කරන ලද වර්ෂය : | |
| ඉදි කරන ලද තැනැත්තාගේ නම සහ ලිපිනය : | |
| ඉදි කරන ලද රට : | |
| ප්‍රචාලන වර්ගය : | |
| සවිකළ ප්‍රචාලන බලය : | |
| ඉන්ධන : | |
| යෝජිත මෙහෙයුම් ප්‍රදේශය : | |
| යාත්‍රාවේ නිර්මාණ කාණ්ඩය : | |
| යෝජිත පිරිස් යෙදවීම : | |

| *2 වන කොටස : යාත්‍රාවේ ඉතිහාසය - පෙර ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර* | |
|---|---|
| නම (1 වන කොටසට වඩා වෙනස් නම්) : | |
| පෙර නම් : | |
| පෙර ලියාපදිංචි කිරීමේ අංකය : | |
| පෙර ලියාපදිංචි කිරීම සිදු කළ වරාය : | |
| පෙර ලියාපදිංචි කිරීම සිදු කළ රට : | |
| ලියාපදිංචි දිග : | |

3 වන වගන්තිය : තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

සටහන - තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීම උපරිම වශයෙන් මාස හයක් සඳහා වලංගු විය යුතු අතර 2023 වෙළඳ නැව් (සම්මුතිය නොවන යාත්‍රා) නියෝගවල 7 වන නියෝගයේ (3) වන අනුනියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා පමණක් වලංගු විය යුතු ය.

| | |
|---|---|
| ඉල්ලීමේ අරමුණ | |
| ශ්‍රී ලංකා ජල තීරයේ සිටින අතරතුර කාලයේ දී යාත්‍රාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් | |
| දේශීය නියෝජිතයා/ අනුනියෝජිතයා පිළිබඳ විස්තර | |
| P & I රක්ෂණයේ නම සහ ලිපිනය (රක්ෂණ සහතිකය අමුණනු ලැබිය යුතු ය) | |

| *4 වන වගන්තිය : ඉල්ලුම්කරුගේ විස්තර* | |
|---|---|
| ඉල්ලුම්කරුගේ නම : | |
| ඉල්ලුම්කරුගේ ලිපිනය : | |
| දුරකථන අංකය : | |
| විද්‍යුත් තැපැල් ලිපිනය : | |
| අයිතිකරුගේ නම සහ ලිපිනය : (සංස්ථාපිත ආයතනයක් විසින් යාත්‍රාවේ හිමිකාරීත්වය දරනු ලබන්නේ නම්) | |
| සභාපතිවරයාගේ/ ප්‍රධානියාගේ නම/ ලිපිනය සහ ජාතිකත්වය : | |
| අධ්‍යක්ෂවරුන්ගේ නම්/ ලිපිනයන් සහ ජාතිකත්වය : | |

............................................................................... හි පදිංචි ........................................................................ වන මම මෙහි සඳහන් යාත්‍රාව ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය මේ සමග ඉදිරිපත් කරමි. ඉහත සඳහන් විස්තර මාගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව සත්‍ය බව සහ නිරවද්‍ය බව සහතික කරමි.

නම : අත්සන :

දිනය:

**II** වන උපලේඛනය (5(5) වන නියෝගය)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ලියාපදිංචි කිරීමේ සහතිකය - සම්මුතිය නොවන යාත්‍රා**

**තාවකාලික/ තාවකාලික මෙහෙයුම්/ පූර්ණ**

යාත්‍රා වර්ගය : RIB/ මෝටර්/ යාත්‍රා/ මෝටර් හෝ රුවල් පාරුව

යාත්‍රා කාණ්ඩය :

මෙහෙයුම් ප්‍රදේශය :

යාත්‍රාව පිළිබඳ විස්තර :

| | |
|---|---|
| යාත්‍රාවේ නම : | විශේෂ අංක : |
| ලියාපදිංචි අංකය : | ලියාපදිංචි කළ වරාය : |
| IMO අංකය (තිබේ නම්) : | ඉදිකළ දිනය : |
| නෞකා බඳෙහි අංකය : | නැව් බඳ තනා ඇති ද්‍රව්‍යය : |
| දිග : | ප්‍රචාලනය : |
| සවි කළ බලය : | ඉන්ධන : |
| දළ ටොන් බර: | ශුද්ධ ටොන් බර : |

* නෞකා තලය තනනු ලැබූ හෝ ඒ හා සමාන ඉදිකිරීම් අවස්ථාවක හෝ අදාළ වේ නම්, ප්‍රධාන අංගයක පරිවර්තනයක් හෝ වෙනස් කිරීමක් හෝ නවීකරණයක් සඳහා වැඩ ආරම්භ කරන ලද දිනය.

ලියාපදිංචි හිමිකාරීත්වය පිළිබඳ විස්තර

| අයිතිකරුගේ නම/නම් | අයිතිකරුගේ ලිපිනය/ලිපිනයන් | දරනු ලබන කොටස් ප්‍රමාණය |
|---|---|---|
| ................................................................. | ........................................................ | ........................................................ |

මේ සහතිකයේ සඳහන් කරන ලද නෞකාව සහ ලියාපදිංචි හිමිකාරීත්වය පිළිබඳ විස්තර සම්මුතිය නොවන යාත්‍රා රෙජිස්ටරයේ ලියාපදිංචි කර ඇති විස්තරවලට අනුකූල බවට මම මෙයින් සහතික කරමි.

අවස්ථානුරූප සහ තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීමේ සහතික එකී සහතික නිකුත් කරනු ලබන දින සිට මාස හයක කාලසීමාවක් සඳහා වලංගු වේ.

නිකුත් කරන ලද ස්ථානය : නිකුත් කරන ලද දිනය :

බලයලත් නිලධරයාගේ නම/අත්සන සහතිකකරණ ආයතනයේ මුද්‍රාව හෝ ලකුණ

## III වන උපලේඛනය

### අදාළ ගාස්තු

සම්මුතිය නොවන යාත්‍රා - ජාත්‍යන්තර වෙළඳාමේ යෙදෙන

1. ලියාපදිංචි ගාස්තු

| | |
|---|---|
| (අ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 500 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ආ) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 75 ක් සහ ශු. ටො. 1 ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

2. අවස්ථානුරූප ලියාපදිංචි කිරීම (මාස 6 ක් සඳහා වලංගු වූ)

| | |
|---|---|
| (අ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 200 |
| (ආ) සම්මුතිය නොවන (මීටර් 24 කට වැඩි) විශාල යාත්‍රා | ඇ.ඩො. 400 |

3. තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීම

| | |
|---|---|
| (අ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 250 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ආ) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 400 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

| | |
|---|---|
| 4. ලියාපදිංචි කිරීමේ සහතිකයක් නැවත නිකුත් කිරීම (හිමිකාරීත්වය වෙනස් වීමක් හෝ සැලකිය යුතු වෙනස් කිරීමකින් පසු) | ඇ.ඩො. 300 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

5. සහතිකය නිකුත් කිරීම

| | |
|---|---|
| (අ) කුඩා යාත්‍රා සංග්‍රහයට අදාළ සහතිකයක් | ඇ.ඩො. 150 |
| (ආ) සම්මුතිය අදාළ නොවන විශාල යාත්‍රා සංග්‍රහයට අදාළ සහතිකයක් | ඇ.ඩො. 200 |
| (ඇ) වෙනත් ව්‍යවස්ථාපිත සහතික | එක් සහතිකයක් සඳහා ඇ.ඩො. 150 බැගින් |

6. සමීක්ෂණ ගාස්තු

(අ) වාර්ෂික සමීක්ෂණ ගාස්තු

| | |
|---|---|
| (i) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 200 |
| (ii) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 350 |

(ආ) අලුත් කිරීමේ/ විශේෂ සමීක්ෂණ ගාස්තු

| | |
|---|---|
| (i) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 350 |
| (ii) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 500 |

<u>ශ්‍රී ලංකා ජල තීරයේ වෙළඳාමේ යෙදෙන සම්මුතිය නොවන යාත්‍රා</u>

1. ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | |
|---|---|
| (අ) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා | ඇ.ඩො. 75 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ආ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 250 ක් සහ ශු. ටො 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ඇ) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 20 කට වැඩි) | ඇ.ඩො. 250 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

2. අවස්ථානුරූපී ලියාපදිංචි කිරීම (මාස 6 ක් දක්වා වලංගු වූ)

| | |
|---|---|
| (අ) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා | ඇ.ඩො. 25 |
| (ආ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 100 |
| (ඇ) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 250 |

3. තාවකාලික මෙහෙයුම් ලියාපදිංචි කිරීම

| | |
|---|---|
| (අ) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා | ඇ.ඩො. 75 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ආ) කුඩා යාත්‍රා (මීටර් 24 ක් දක්වා වූ) | ඇ.ඩො. 100 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |
| (ඇ) සම්මුතිය අදාළ නොවන විශාල යාත්‍රා (මීටර් 24 කට වැඩි) | ඇ.ඩො. 200 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

| | |
|---|---|
| 4. ලියාපදිංචි කිරීමේ සහතිකයක් නැවත නිකුත් කිරීම (හිමිකාරීත්වය වෙනස් වීමක් හෝ සැලකිය යුතු වෙනස් කිරීමකින් පසු) | ඇ.ඩො. 150 ක් සහ ශු. ටො. 1ක් සඳහා ඇ.ඩො. 1 බැගින් |

| | |
|---|---|
| 5. සහතිකය නිකුත් කිරීම | |
| (අ) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා සංග්‍රහයට අදාළ සහතිකයක් | ඇ.ඩො. 75 |
| (ආ) කුඩා සංග්‍රහයට අදාළ සහතිකයක් | ඇ.ඩො. 100 |
| (ඇ) සම්මුතිය නොවන විශාල යාත්‍රා සංග්‍රහයට අදාළ සහතිකයක් | ඇ.ඩො. 150 |
| (ඈ) වෙනත් ව්‍යවස්ථාපිත සහතික | එක් සහතිකයක් සඳහා ඇ.ඩො. 100 බැගින් |
| 6. සමීක්ෂණ ගාස්තු | |
| (අ) වාර්ෂික සමීක්ෂණ ගාස්තු | |
| (i) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා | ඇ.ඩො. 80 |
| (ii) කුඩා යාත්‍රා (මීටර් 20 ක් දක්වා වූ) | ඇ.ඩො. 150 |
| (iii) සම්මුතිය නොවන විශාල යාත්‍රා (මීටර් 24කට වැඩි) | ඇ.ඩො. 250 |
| (ආ) අලුත් කිරීමේ/ විශේෂ සමීක්ෂණ ගාස්තු | |
| (i) අභ්‍යන්තර ජල තීරයේ ක්‍රියාත්මක වන යාත්‍රා | ඇ.ඩො. 100 |
| (ii) කුඩා යාත්‍රා (මීටර් 20 ක් දක්වා වූ) | ඇ.ඩො. 200 |
| (iii) සම්මුතිය අදාළ නොවන විශාල යාත්‍රා (මීටර් 24කට වැඩි) | ඇ.ඩො. 350 |
| 7. පෞද්ගලික යාත්‍රා [4 වන කාණ්ඩය] - ක්‍රීඩා හෝ විනෝදය පිණිස පෞද්ගලික භාවිතය සඳහා වන (කුළියට දීම සඳහා නොවන) යාත්‍රා සඳහා වන අනුකූලතා වාර්තා ලේඛනයක් නිකුත් කිරීම | ඇ.ඩො. 150 |

## IV වන උපලේඛනය

**(22(3) වන නියෝගය)**

| | | | | |
|---|---|---|---|---|
| **MSS** | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | ලේඛන අංකය | | SR-FO-11 |
| | **නෞකා ලියාපදිංචි කිරීම සහ ආරක්ෂක ඒකකය** | පළමු නිකුත් කිරීමේ දිනය | | 2015-12-28 |
| | | සමාලෝචනය කළේ | | MR |
| | | අනුමත කළේ | | DGMS |
| | **හදිසි අනතුරු වාර්තා කිරීමේ ආකෘති පත්‍රය** | ප්‍රතිශෝධිත තත්ත්වය | | 0 |
| | | ප්‍රතිශෝධිත දිනය | | |

**යාත්‍රා හදිසි අනතුරු හෝ අනතුර පිළිබඳ වාර්තාව**

**I. යාත්‍රාවේ විස්තර**

| | | | | |
|---|---|---|---|---|
| 1. යාත්‍රාවේ/ ධජයේ නම : | 2. IMO අංකය : | 3. ඉදිකළ වර්ෂය : | 4. දළ ටොන් බර : | 5. ශුද්ධ ටොන් ප්‍රමාණය : |
| 6. යාත්‍රා වර්ගය : | 7. ප්‍රචාලනය : | 8. ඉදිකළ ස්ථානය : | | |
| 9. අයිතිකරුගේ නම : | 10. කළමනාකරණ සමාගමේ නම, ලිපිනය, සහ දුරකථන අංකය : | | | |

| | | | |
|---|---|---|---|
| 11. (අ) නෞකාධිපතිවරයාගේ හෝ නෞකාව භාරව සිටින නිලධරයාගේ නම : | (ආ) පුරවැසිභාවය : | (ඇ) උපන් දිනය : | (ඈ) ලිපිනය : |

**II. හදිසි අනතුරු විස්තර**

| | | | | | |
|---|---|---|---|---|---|
| 12. (අ) හදිසි අනතුර සිදු වූ දිනය : | (ආ) වේලාව (දේශීය හෝ කලාපීය) : | (ඇ) UTC : | (ඈ) දිනයේ වේලාව : | | |
| | | | දිවා කාලය | රාත්‍රී කාලය | සන්ධ්‍යා කාලය |

| | |
|---|---|
| 13. හදිසි අනතුරේ භූගෝලීය පිහිටීම<br>අක්ෂාංශය :<br>දේශාංශය : | 14. භූගෝලීය ස්ථානය : |

| | | |
|---|---|---|
| 15. (අ) හදිසි අනතුර සිදු වූයේ ගමන් කරමින් සිටින අතරතුර දී නම්, පිටත් වූ වරාය : | (ආ) පිටත් වූ දිනය : | (ඇ) ළඟාවීමට නියමිත වරාය : |

| | | | |
|---|---|---|---|
| 16. (අ) භාණ්ඩවල ස්වභාවය : (විස්තර කර ප්‍රමාණයන් දිගු ටොන්වලින් දක්වන්න) | (ආ) වියළි භාණ්ඩ ප්‍රමාණය: | (ඇ) ද්‍රව තොග ප්‍රමාණය : | (ඈ) නැව් තට්ටු භාණ්ඩ ප්‍රමාණය : |
| 17. හදිසි අනතුරට පෙර වේගය නාවික සැතපුම්වලින් : | 18. හදිසි අනතුරට පෙර සත්‍ය වශයෙන් ගමන් කළ මාර්ගය : | 19. ඉදිරියට පාවීමට අවශ්‍ය ගැඹුර : | 20. පසුපසට පාවීමට අවශ්‍ය ගැඹුර : |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21. හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ පැවති වායුගෝලීය තත්ත්වයන් : | | | | | |
| පැහැදිලි | අර්ධ වශයෙන් වළාකුළු සහිත | මීදුම | වර්ෂාව | හිම | වෙනත් (නිශ්චිතව දක්වන්න) |

| | | | |
|---|---|---|---|
| 22. දෘශ්‍යතාව<br>සැතපුම් දෙකකට අඩු<br>සැතපුම් 2-5 අතර<br>සැතපුම් 5 ට වැඩි | 23. සුළං<br>වේගය අඩු<br>මද කුණාටුවල සිට තරමක් සැර කුණාටු සහ චණ්ඩ මාරුත දක්වා | 24. මුහුද<br>නිශ්චල සිට සුළු වශයෙන්<br>මධ්‍යස්ථ සිට රළු<br>රළු | 25. සුළං දිශාව<br>26. මුහුදේ දිශාව<br>27. දියවැල් දිශාව |

| | |
|---|---|
| 28. නාවික උපකරණ (පහත දැක්වෙන අයිතම එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සලකුණු කරන්න.)<br><br>රේඩාර් (SB සහ/හෝ X පටි) ARPA<br>ක්‍රියාවිරහිත ක්‍රියාවිරහිත<br>භාවිත කළ | 29. සන්නිවේදන උපකරණ (පහත දැක්වෙන අයිතම එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සලකුණු කරන්න).<br><br>ගුවන් විදුලි දුරකථනය / වෙනත් වර්ගවල සන්නිවේදන<br>වෙනත් යාත්‍රා සමග භාවිත කරන / වෙනත් යාත්‍රා සමග භාවිත කරන<br>ගොඩබිම මධ්‍යස්ථානය සමග භාවිත කරන / ගොඩබිම මධ්‍යස්ථානය සමග භාවිත කරන<br>භාවිත නොකරන / භාවිත නොකරන |
| 30. ඔබේ යාත්‍රාවෙන් ස්වයංක්‍රීය අනතුරු ඇඟවීම් සංඥා සම්ප්‍රේෂණය කරන ලද්දේ ද?<br>ඔව්/ නැත | 31. එකී අවස්ථාවේ දී අදාළව පැවති මාර්ග රීති<br><br>ජාත්‍යන්තර වෙනත් (නිශ්චිතව දක්වන්න) |

**32. සිද්ධියේ වර්ගය (පළමු අනතුරු සිද්ධිය)**

| | | |
|---|---|---|
| (අ) | ඝට්ටනය | වෙනත් නෞකාවක වැදීම (සිදු වූයේ ගමන් කරන විට දී ද, නැංගුරම් ලා තිබිය දී ද, රැහැනෙන් බැඳ තබා තිබිය දී ද යන්න නොසලකා) |
| (ආ) | අතරමං වීම/ගොඩබිම ගැටීම | ගොඩ බිමෙහි හෝ වෙරළෙහි හෝ මුහුදු පත්ලෙහි හෝ දිය යට ඇති වස්තූන්වල (සුන්බුන්වල ගැටීම) |
| (ඇ) | ස්පර්ශ වීම | ඝට්ටනයට ඇතුළත් වස්තුවක් නොවන වෙනත් ස්ථාවර හෝ පාවෙන වස්තුවක වැදීම |
| (ඈ) | ගිනිගැනීම හෝ පිපිරීම | |
| (ඉ) | නෞකා බඳ අක්‍රීය වීම | ඉහත සඳහන් කිසිවක් හේතුවෙන් ඇති නොවූ |
| (ඊ) | යන්ත්‍ර සූත්‍රවලට හානි සිදුවීම | ඇදගෙන යාමට හෝ ගොඩබිම සහාය අවශ්‍ය කරනු ලැබූ |
| (උ) | නෞකාවට හානි සිදුවීම | ඉහත සඳහන් කිසිවක් හේතුවෙන් ඇති නොවූ |
| (ඌ) | පෙරළීම/ ඇලවීම | ඉහත සඳහන් කිසිවක් හේතුවෙන් ඇති නොවූ |

| | | |
|---|---|---|
| (එ) | අතුරුදහන් වීමඃ නැති වූ බව උපකල්පනය කරන | |
| (ඒ) | පීඩා | |
| (ඔ) | වෙනත් | ඉහත සඳහන් කිසිවකින් ආවරණය නොවන වෙනත් යමක් |

33. හදිසි අනතුර පිළිබඳ විස්තරය (හදිසි අනතුරට හේතු වූ සහ එය සිදු වූ අවස්ථාවේ පැවති සිද්ධි සහ අවස්ථානුගත කරුණු අවශ්‍ය නම්, රූපසටහනක් සහ අමතර කොළ අමුණන්න) :

| 34. සේවක පිරිසේ සංඛ්‍යාව | නාවික පිරිස | මගීන් | වෙනත් | මුළු ගණන | 35. තක්සේරු කළ දේපළ හානි |
|---|---|---|---|---|---|
| (අ) නොකාස්ථ | | | | | (අ) යාත්‍රාවට |
| (ආ) මියගිය | | | | | (ආ) භාණ්ඩවලට |
| (ඇ) අතුරුදහන් වූ | | | | | (ඇ) වෙනත් දේපළවලට |
| (ඈ) තුවාල වූ | | | | | 36. යාත්‍රාවල මුළුමනින්ම අලාභ හානී වී ඇත් ද?<br>ඔව් නැත |

37. සටහන් (වෙරළබඩ මධ්‍යස්ථානවලින් සහ වෙනත් යාත්‍රාවලින් ලබාදුන් සහාය සහ නිවැරදි කිරීම සඳහා ආරක්ෂක පියවර දක්වන්න. අවශ්‍ය නම්, අමතර කොළ අමුණන්න.) :

| 38. හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ රාජකාරියේ යෙදී සිටි නැව් තට්ටු නිලධරයා : | | 39. හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ රාජකාරියේ යෙදී සිටි ඉංජිනේරුවරයා : | | |
|---|---|---|---|---|
| නම : | | නම : | | |
| තනතුර : | බලපත්‍ර අංකය : | තනතුර : | | බලපත්‍ර අංකය : |
| 40. වාර්තාව ඉදිරිපත් කළ දිනය : | 41. ඉදිරිපත් කළේ (නම මුද්‍රණය කරන්න) : | 42. අත්සන : | | 43. තනතුර : |

| | | | |
|---|---|---|---|
| **MSS** | වෙළඳ නාවික මහලේකම් කාර්යාලය<br>නෞකා ලියාපදිංචි කිරීම සහ ආරක්ෂක ඒකකය<br>හදිසි අනතුරු වාර්තා කිරීමේ ආකෘති පත්‍රය | ලේඛන අංකය | SR-FO-11 |
| | | පළමු නිකුත් කිරීමේ දිනය | 2015-12-28 |
| | | සමාලෝචනය කළේ | MR |
| | | අනුමත කළේ | DGMS |
| | | ප්‍රතිශෝධිත තත්ත්වය | 0 |
| | | ප්‍රතිශෝධිත දිනය | |

**පුද්ගල හානී හෝ ජීවිත අහිමිවීම පිළිබඳ වාර්තාව**

**I . යාත්‍රාවේ විස්තර**

| | | |
|---|---|---|
| 1. යාත්‍රාවේ නම : | 2. IMO අංකය : | 3. කළමනාකරණ සමාගමේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ටෙලිෆැක්ස් අංකය : |
| 4. යාත්‍රා වර්ගය : | 5. ප්‍රවාලනය : | |
| 6. අයිතිකරුගේ නම සහ ලිපිනය : | | |

**II . තුවාල සිදු වූ, මියගිය හෝ අතුරුදහන් වූ (මියගිය බවට විශ්වාස කරන) තැනැත්තාගේ විස්තර**

| | | |
|---|---|---|
| 7. (අ) තැනැත්තාගේ නම : | (ආ) නිවසේ ලිපිනය : | (ඇ) උපන් දිනය : |
| | | (ඈ) පුරවැසිභාවය : |

| | |
|---|---|
| 8. මුහුදු යාත්‍රාකරුගේ පොතේ හෝ ගමන් බලපත්‍රයේ අංකය : | 9. යාත්‍රාව තුළ දරන ලද තනතුර හෝ නිලය : |
| 10. හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ නිරතව සිටි කටයුත්ත : | 11. නාවික පිරිසේ සාමාජිකයකු හෝ වෙරළ සේවකයකු නම් :<br><br>මුරකාවලෙහි යෙදී සිටින    රාජකාරියේ යෙදී සිටින    වෙනත් |
| 12. (අ) හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ ආසන්නතම අධීක්ෂකවරයාගේ නම | (ආ) යාත්‍රාව තුළ එකී අධීක්ෂකවරයා විසින් දරන ලද නිලය හෝ තනතුර |

**III හදිසි අනතුර හෝ අනතුර පිළිබඳ විස්තර**

| | | | | | |
|---|---|---|---|---|---|
| 13. (අ) හදිසි අනතුර සිදු වූ දිනය : | (ආ) වේලාව (දේශීය හෝ කලාපීය) : | (ඇ) UTC : | (ඈ) දිනයේ වේලාව : | | |
| | | | දිවා කාලය | රාත්‍රී කාලය | සන්ධ්‍යා කාලය |
| 14. හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ යාත්‍රාවේ භූගෝලීය පිහිටීම : | | | | | |

| | | |
|---|---|---|
| 15. (අ) හදිසි අනතුරු සිදු වූයේ ගමන් කරමින් සිටින අතරතුර දී නම්, පිටත් වූ වරාය : | (ආ) පිටත් වූ දිනය : | (ඇ) ළඟා වීමට නියමිත වරාය : |

| | | |
|---|---|---|
| 16. (අ) හදිසි අනතුරේ ප්‍රතිඵලය<br>(උචිත පරිදි, පහත දැක්වෙන තුවාල සිදුවීම හෝ මියයාම පිළිබඳ විස්තර සටහන්කරන්න)<br>තුවාල සිදුවීම | මියයාම | අතුරුදහන්වීම |
| (ආ) තුවාල සිදුවීමේ ස්වභාවය : | (ඇ) අශක්නුකෘතව සිටි මුළු දින ගණන : | |
| (ඈ) මියයාමට හේතුව : | (ඉ) මරණය සිදු වූ අවස්ථාවේ පුද්ගලයා සිටි ස්ථානය : | |
| | (ඊ) මරණය සිදු වූ දිනය : | |

| | | | |
|---|---|---|---|
| **MSS** | වෙළඳ නාවික ලේකම් කාර්යාලය නෞකා ලියාපදිංචි කිරීම සහ ආරක්ෂක ඒකකය<br>හදිසි අනතුරු වාර්තා කිරීමේ ආකෘති පත්‍රය | ලේඛන අංකය | SR-FO-11 |
| | | පළමු නිකුත් කිරීමේ දිනය | 2015-12-28 |
| | | සමාලෝචනය කළේ | MR |
| | | අනුමත කළේ | DGMS |
| | | ප්‍රතිශෝධිත තත්ත්වය | 0 |
| | | ප්‍රතිශෝධිත දිනය | |

හදිසි අනතුර පිළිබඳ විස්තරය (හදිසි අනතුරට හේතු වූ සිද්ධි සහ එය සිදු වූයේ කෙසේ ද යන්න දක්වන්න. අවශ්‍ය නම්, රූප සටහනක් සහ අමතර කොළ අමුණන්න.)

17. හදිසි අනතුර පිළිබඳ සාක්ෂිකරුවන් (හැකි නම්, යටත් පිරිසෙයින් සාක්ෂිකරුවන් දෙදෙනෙක්වත්)

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |

**IV** සහාය හා නිර්දේශ

| | | |
|---|---|---|
| 18. (අ) වෛද්‍යවරයකුට (වෛද්‍ය) පණිවිඩයක් යවා ඇත් ද : | (ආ) යවා ඇත්නම්, පළමු පණිවිඩය යවන ලද දිනය : | (ඇ) යවා ඇත්නම්, පළමු පණිවිඩය යැවූ වේලාව (දේශීය හෝ කලාපීය විස්තරය): |

| | | | |
|---|---|---|---|
| 19. (අ) ප්‍රතිකාර ලබා දී ඇත් ද? | (ආ) ඇත්නම්, කවුරුන් විසින් ද? | | |
| ඔව් නැත | නෞකාවේ වෛද්‍යවරයා | වෙනත් නෞකාවල සේවක පිරිස | වෙනත් (නිශ්චිතව දක්වන්න) |

| | | | |
|---|---|---|---|
| 20. ලබාදුන් ප්‍රතිකාර කෙටියෙන් විස්තර කරන්න (වෛද්‍යවරයකු හැර වෙනත් තැනැත්තකු විසින් ප්‍රතිකාර ලබා දී ඇත්නම්) : | | | |
| 21. (අ) එම තැනැත්තා රෝහල්ගත කරනු ලැබුවේ නම්, රෝහලේ නම : | | (ආ) රෝහලේ ලිපිනය : | |
| 22. මේ අනතුරට අදාළ නිවැරදි කිරීමේ ආරක්ෂක පියවර පිළිබඳ නිර්දේශ : | | | |
| 23. වාර්තාව ඉදිරිපත් කළ දිනය : | 26. ඉදිරිපත් කළේ (නම මුද්‍රණය කරන්න) : | 27. අත්සන : | 28. තනතුර : |

## V වන උපලේඛනය

### නිර්දේශිත හදිසි අවස්ථා උපදෙස් ආකෘති පත්‍රය

**(27(10) නියෝගය)**

පහත දැක්වෙන තොරතුරු ඇතුළත් අවස්ථා උපදෙස් දැන්වීමක් 77 වන වගන්තියේ නියමයන් සපුරාලන්නේ ය.

හදිසි අවස්ථා උපදෙස්

මුහුදේ රළු කාලගුණය, අන්තරාදායක හරස් වැලිපර හරහා ගමන් කිරීම හෝ ජලගැලීම්:-

1. නෞකාවට ජලය ඇතුළු වීම වැළැක්වීම සඳහා සියලු ජල පරිරෝධක සහ කාලගුණ පරිරෝධක දොරවල්, නැව් හවුල් සහ වායු නල වසාදමන්න.

2. නෞකා පතුලේ ජලය රැඳීම හේතුවෙන් ස්ථායීතාව නැතිවීම වැළැක්වීම සඳහා නෞකා පතුල වියළිව තබා ගන්න. ජලය ඉවත් කිරීම සඳහා විදුලි බලයෙන් ක්‍රිය කරන බණ්ඩි පොම්ප, අත් පොම්ප සහ බාල්දි භාවිත කරන්න.

3. ඒ සඳහා අවසර දී ඇති විට, නෞකා පතුලේ පොම්ප වෙනුවට ගිනි පොම්ප භාවිතා කිරීම සඳහා වැඩපිළිවෙල යොදන්න.

4. නෞකා බඳ ඡේදනය කරන ලද සියලු ම චූෂණ සහ විසර්ජන රැහැන්වල කාන්දු ඇත්දැයි පරීක්ෂා කරන්න.

5. මඟීන් නෞකාධිපතිවරයා විසින් විධාන කරනු ලබන පරිදි අසුන්වල රැඳී සිටිය යුතු අතර, සමානව විසිරී සිටිය යුතු ය.

6. නෞකාධිපතිවරයා විසින් උපදෙස් දෙනු ලැබූ විට, මඟීන් විසින් ජීවිතාරක්ෂක ජැකට්ටු පළඳිනු ලැබිය යුතු ය.

7. සහාය අවශ්‍ය විට, ගුවන්විදුලි දුරකථනයෙන් පළකරන හදිසි අවස්ථා සන්නිවේදන දැන්වීම් ඇතුළත් කාර්යපටිපාටි අනුගමනය කරන්න.

8. ගලවා ගැනීමේ යාත්‍රා (ජීවිතාරක්ෂක ප්ලාවකයන්), (සුළං පිරවිය හැකි) පාරු, (සුළං පිරවිය හැකි) බෝයා උපකරණ, බෝට්ටු දියත් කිරීම සඳහා සූදානම් කරන්න.

9. නෞකාවේ රැඳී සිටින තැනැත්තන්ට ඇති අවදානම, යාත්‍රාව හැරයාමේ අවදානම ඉක්මවන බව නෞකාධිපතිවරයාගේ මතය වන්නේ නම් මිස, යාත්‍රාව අත්හැර දැමීමට උපදෙස් දෙනු නොලැබිය යුතු ය.

මුහුදට වැටුනු තැනැත්තන්:-

1. ජීවිතාරක්ෂක බෝයාවක් හැකිතාක් එකී තැනැත්තා සමීපයට වැටෙන පරිදි මුහුදට විසිකරන්න.

2. මුහුදට වැටුණු තැනැත්තා නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂණ ස්ථානයක් පිහිටුවන්න.

3. මුදවා ගැනීමේ බෝට්ටුව දියත් කර මුහුදට වැටුණු තැනැත්තා මුදා ගැනීම සඳහා මුදවා ගැනීම් බෝට්ටුව දියත් කර හසුරුවන්න. නැතහොත් මුහුදට වැටුණු තැනැත්තා මුදා ගැනීම සඳහා යාත්‍රාව හසුරුවන්න.

4. නාවික පිරිසේ සාමාජිකයකුට ජීවිතාරක්ෂක ජැකට්ටුවක් පැළඳීමට සලස්වා එකී සාමාජිකයාට ආරක්ෂක රැහැනක් සවි කරන්න. ඉන්පසු එකී සාමාජිකයා අවශ්‍ය නම් මුහුදට වැටුණු තැනැත්තාට සහාය වීම සඳහා මුහුදට පැනීමට සූදානමින් තබන්න.

5. එකී තැනැත්තා සිටින ස්ථානය ක්ෂණිකව සොයාගත නොහැකි වූ අවස්ථාවක ගුවන් විදුලි දුරකථනයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ ඒ අසල ඇති අනෙකුත් යාත්‍රාවලට ඒ බව දැනුම් දෙන්න.

6. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නිදහස් කරන තෙක් හෝ දිගට ම සෝදිසි කරගෙන යාම ප්‍රායෝගික නොවන බවට නෞකාධිපති- වරයා විසින් සලකනු ලබන තෙක් දිගට ම සෝදිසි කරගෙන යන්න.

ගිනි:-

1. ගින්නට වාතය සැපයීම නවත්වන්න - නැව් කවුළු, කවුළු, දොරවල්, සංවාතක උපකරණ සහ වා කවුළු වැනි දෑ වසා දමා සංවාතක පද්ධතිය ක්‍රියා විරහිත කරන්න.

2. හැකි නම් ගිනිගත් මැදිරියට විදුලිය සපයන විදුලි පද්ධතිය ක්‍රියාවිරහිත කරන්න.

3. ස්ථාවර ගිනි නිවාරණ පද්ධතියක් සවිකර ඇත්නම් එය ක්‍රියාත්මක කරන්න.

4. එසේ කිරීම ආරක්ෂිත විට, ජ්වාලීය ද්‍රව හෝ ග්‍රීස් ආශ්‍රිත ගිනි සඳහා ගිනිදැල්ලේ පතුලෙහි සුවාහ්‍ය ගිනි නිවනයක් ද සාමාන්‍ය දාහ්‍ය ද්‍රව්‍යවල ඇති වන ගිනි සඳහා ජලය ද භාවිත කරන්න. විදුලිය ආශ්‍රිත ගිනි සඳහා ජලය භාවිත නොකරන්න.

5. ගිනි ගැනීම යන්ත්‍ර සූත්‍ර ඇති අවකාශයක හටගෙන ඇති අවස්ථාවක, ඉන්ධන සැපයුම සහ සංවාතන පද්ධතිය ක්‍රියාවිරහිත කර ස්ථාවර ගිනි නිවාරණ පද්ධතියක් සවිකර ඇත්නම් එය ක්‍රියාත්මක කරන්න.

6. සුළඟින් ගින්නට ඇති වන බලපෑම අවම වන පරිදි යාත්‍රාව හසුරුවන්න.

7. ගින්න පාලනය කිරීමට අපොහොසත් වූ අවස්ථාවක, ගුවන් විදුලි දුරකථනයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ අසල ඇති වෙනත් යම් යාත්‍රාවකට ඒ බව දැනුම් දෙන්න.

8. මගීන් ගින්නෙන් ඈත් කර ඔවුන්ට ජීවිතාරක්ෂක ජැකට්ටු පැළඳීමට සලස්වා, අවශ්‍ය විට, යාත්‍රාව අත්හැර දැමීමට සූදානම් වන්න.

EOG 01 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.